

# වෛශාක්‍ය වර්ණනා

බු.ව.2567 | ක්‍රි.ව.2023

නිවෙන දම්සිළු ප්‍රඥාලෝකයෙන් දල්වාලනු වස්, කැලණිය විශ්වවිද්‍යාලයීය මූල්‍ය ශිෂ්‍ය සංගමය විසින් ඉදිරිපත් කරනු ලබන, වාර්ෂික විද්‍යුත් දහම් සඟරාවේ තෙවන වෙළුම

# පෙළගැස්ම


1 අර්ථයන් හා පිළිවෙත.........................................03

2 මූල්‍ය අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමාගේ පණිවිඩය........04

3 මූල්‍ය ශිෂ්‍ය සංගමයේ වෙසක් පණිවිඩය.........................05

4 වෛශාක්‍ය වර්ණනා.......................................06-50

5 වෛශාඛ්‍යාර්ථ ප්‍රෙහේලිකා.......................................51


මෙහි පළවන සියලුම ලිපි මූල්‍ය අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීයන් විසින් සකස් කරන ලද ඒවා වන අතර, එහි සියලුම වගකීම් එකී රචකයන් සතුය.

# අර්ථයන් හා පිළිවෙත්

"වෛශාක්‍ය වර්ණනා"

තිලෝගුරු බුදුපියාණන් වහන්සේගේ ශාක්‍යසිංහ මංගල්‍යය සමරනු වස් කැලණිය විශ්වවිද්‍යාලීය මූල්‍ය ශිෂ්‍ය සංගමය වන අපගේ ආමිසමය පිදුම වෛශාක්‍ය වර්ණනා සඟරාවේ තෙවන වෙළුම මෙලෙස දොරට වඩින වගයි.

ශ්‍රී ලාංකීය බෞද්ධ පුනුරුදයත් සමග (1875) වසරේදී බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ වූ ශ්‍රී විද්‍යාලංකාර පිරිවෙන (1959) වසරේ දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය බවට පත්වී (1978) වර්ෂයේදී කැලණිය විශ්වවිද්‍යාලය බවට පත්විය.

ආරම්භයේ සිට අද දක්වා පැමිණි ගමන් මගතුල බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් ජාතික මෙහෙවරක් ඉටුකරන කැලණිය විශ්වවිද්‍යාලය වර්තමානයේදීද බෞද්ධ හා පාලි අධ්‍යයනය වෙනුවෙන් විශිෂ්ට කාර්යයක් ඉටු කරයි.

අවිද්‍යාවේ අඳුර දුරුකොට දහමින් සිත් සනසාලීමට මූල්‍ය අධ්‍යයන අංශය ලෙස අප ගන්නා මේ ප්‍රයත්නයේ සැබෑම අරුත වන්නේ ලෞකික මිත්‍යාවන්ගෙන් මුදවා අරුත්සම්පන්න තෙමගුලක් වෙනුවෙන් පෙලගැසීමයි.

කැලණිය විශ්වවිද්‍යාලයීය මූල්‍ය අධ්‍යයන අංශය මගින් තෙවන වරට එළිදක්වන වෛශාක්‍ය වර්ණනා සඟරාව ධර්ම දානයක්ම වේවා !!!!
පින්බර වෙසඟකට ආසිරි !!!!

# මූල්‍ය අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමාගේ පණිවිඩය

ගංගා නිම්නයේ සාවුරුද්දක් සැරිසරමින් අවසන වීර්යය ,අධිෂ්ඨානය,ශ්‍රද්ධාව හා ප්‍රඥාව මූලික කොට මනුෂ්‍යය බුද්ධියෙන්ම බුද්ධත්වය සාක්ෂාත් කරගත් තිලෝගුරු අමාමෑණී බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිහි කරන වෙසක් පුර පසළොස්වක පොහොය දිනය සමරනු වස් කැලණිය විශ්වවිද්‍යාලයීය මූල්‍ය අධ්‍යයන අංශයේ ඔබ සැම එක්ව සිදු කරන මෙම ප්‍රයත්නය අගය කොට සලකමි.

සමස්ථ ලෝක සත්ත්වයා කෙරෙහිම දයාව,කරුණාව,මෛත්‍රීය පෙරටු කරගත් දැහැමි සහගත සමාජයක් ගොඩනැඟෙනු ඇතැයි යන ප්‍රාර්ථනය ද සමඟින් සමස්ථ ලෝකවාසී බෞද්ධ ජනතාවට සැනසුම්දායක වෙසක් මංගල්‍යයකට ආසිරි පතමි.




මහාචාර්ය රුවන් අබේසේකර
අංශාධිපති
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය




# මූල්‍ය ශිෂ්‍ය සංගමයේ පණිවිඩය

**“ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරි**
**ධම්මො සුචිණ්ණො සුඛමාවහාති”**

ධර්මයෙහි හැසිරෙන තැනැත්තා ධර්මයෙන් ආරක්ෂා කරයි.

දැවෙන ,තැවෙන සිත් නිවී පහන් කරන අවිද්‍යාවේ අඳුර දුරුකොට ආධ්‍යාත්මයෙන් පිරිපුන් සමාජයක් බිහිකිරීමේ මූලික පදනම නම් ධර්මයයි. දැහැමි සිතිවිලි වලින් පිරිපුන් මානුෂිය ගුණධර්ම වලින් හෙබි සමාජයක් බිහිකිරීමේ බලාපොරොත්තුව පෙරදැරිව වෛශාඛ්‍ය වර්ණනා (2023) මෙලෙස ඔබ වෙත පිරිනමන්නෙමු.

සම්බුදු තෙමඟුල සිහිකරන මේ වෛශාඛ්‍ය මංගල්‍යය සමස්ත ලෝකාවාසී බෞද්ධ ජනතාවගේ ආධ්‍යාත්මික සැපයට හේතු වන පින්බර වෙසක් මංගල්‍යයක් වේවායි අපි බැති සිතින් ප්‍රාර්ථනා කරමු.

මූල්‍ය ශිෂ්‍ය සංගමය
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# බුදුදහමේ දාර්ශනික මුහුණුවර හඳුනාගැනීම හා එමඟින් ගොඩනැගෙන පුද්ගලාභිවෘද්ධිය

ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිහිපත් කෙරෙන උතුම් වෙසක් පුන්පොහෝ දිනය මෙවර ශ්‍රී ලාංකික බෞද්ධ, අබෞද්ධ සියලුදෙනා විසින් සමරනු ලබන්නේ රටවැසියන් විවිධ ගැටලු හා අභියෝගයන්වලට මුහුණ දී ඇති අවස්ථාවකදී ය. එබැවින් පළමුවෙන් ම අපගේ දේශය නැවත සෞභාග්‍ය සම්පන්න දේශයක් බවට පත්වේවා, පීඩාවට පත් ව සිටින රටවැසියන් සුඛිත භාවයට පත්වේවා, සියලුදෙනා තුළ ම භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනය ගොඩනැගේවා යන මෛත්‍රී සහගත ප්‍රාර්ථනාව සිදුකරමි.

බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයා කෙරෙහි මහත් වූ කරුණාවෙන් දේශනාකර වදාරන්නට යෙදුණු දහම, හේතු ඵල මූලික දහමකි. "හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ඣති" කිසියම් හේතුවක් මුල් වීමෙන් ඵලයක් හටගන්නා බවත්, එකී ඵලය ඇති වීමට මුල් වූ හේතුව හඳුනා ගෙන එම හේතුව නැතිකිරීමෙන් ඵලය නැතිකරගත හැකි බව උන්වහන්සේගේ දේශනාවෙහි හරය යි. මෙසේ හරවත් දර්ශනයක් ඉදිරිපත් කරනු ලබන බුදුදහම, ආගමක් ලෙස හඳුන්වා දීමට ඇතැම් පිරිසක් උත්සහ දරනු ලබන ආකාරයත්, විශේෂයෙන් ම බෞද්ධ සමාජයේ බොහෝ දෙනෙකු බුදුදහම ආගමක් බවට පරිවර්තනය කර ගනිමින් කටයුතු කරන ආකාරයත් දැකීමට ලැබීම ඉතා ඛේදජනකය. "ආගම" පිලිබඳ යුරෝපීය පඬිවරුන් විසින් ඉදිරිපත් කර ඇති අදහස් දෙස විමසීමෙන් එය දෙවියන් හා සම්බන්ධ වූ දෙයක් යැයි එක්වරම පැහැදිලිවේ. "මිනිසාට ඉහළින් ඇති මිනිසා පාලනය කරනු ලබන බලවේගයක් පිළිබඳ විශ්වාසය, එක් දෙවියෙක් හෝ දෙවියන් පිළිබඳ විශ්වාසය" ආගම යන්න නිර්වචනය කිරීම සඳහා ඉදිරිපත් වී ඇති වචනාර්ථ වේ. මේ අනුව ආගම යන්න දේව සංකල්පය කේන්ද්‍රගත කරමින් ගොඩනැගෙනු විශ්වාස. ඇදහිලි ආදියෙහි එකතුවක් බැව් පැහැදිලිවේ. මෙනයින් බැලූ කල බුදුදහම, ආගමක් ලෙස කිසිවිටෙකත් හැඳින්විය නොහැකිය. මන්දයත් බුදුදහම තුළ පැහැදිලි කෙරෙන්නේ, "අත්ත දීපා විහරථ භික්ඛවේ අත්ත සරණා අනඤ්ඤ සරණා" ස්වකීය ලෞකික හා ලෝකෝත්තර අභිවෘද්ධිය තමා තුළින් ම, තමා විසින් ම ගොඩනගා ගත යුත්තක් මිස වෙනත් කිසිදු බාහිර බලවේගයකට එය ගොඩනංවා නොදෙන බවයි. පුද්ගලයෙකු ලෙස ස්වකීය පාරිශුද්ධත්වය හෝ කිලිටි බව හෝ තමන්ගේම ක්‍රියාව තුළින් තීරණය වන බවත්, තමාගේ පිරිසිදු බව හෝ අපිරිසිදු බව හෝ වෙනත් කිසිවෙකුට තීරණය කිරීමට නොහැකි බවත් බුදු බුදු දහමේ ඉගැන්වේ. එසේම දේව සංකල්පය මූලික වූ ආගමක් තුළ ප්‍රශ්න කිරීමේ, විමසීමේ, ගවේෂණය කිරීමේ අයිතිය මුළුමනින් ම පාහේ අහුරා ඇත. ඔවුන්ගේ ඉගැන්වීම් අනුව දේව වාක්‍ය ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගත යුතු අතර දෙවියන්ගෙන් ප්‍රශ්න කිරීමට නරයන්ට අයිතියක් නොමැත. එබැවින් විමසීමකින් තොරව දේව වචනය එලෙසින් ම පිළිගැනීමට ආගමික භක්තිකයන්ට සිදු වේ. එය සැබැවින් ම අන්ධ භක්තියකි.

බුදුදහම, ආගමක් ලෙස අර්ථ දැක්විය නොහැකි වන්නට තවත් සාධකයන් ලෙස බුදුදහම තුළ ඇති වීමංසන නිදහස පෙන්වා දිය හැකිය. "ඒහි පස්සිකෝ" එන්න, මේ ධර්මය විමසා බලන්න යැයි බුදුරජාණන් වහන්සේ සැමට ආරාධනා කරනු ලැබීය. තවද වීමංසක, කාලාම වැනි සූත්‍ර දේශනා තුළින් බුදු දහම තුළ ඇති විමසීමේ නිදහස මනාව පැහැදිලි කරයි. බුදුන්වහන්සේ පිරිනිවන් මංචකයෙහි වැඩ සිටිමින් ස්වකීය ශ්‍රාවක සංඝයා අමතා දන්වා සිටියේ තමන් වහන්සේ පිළිබඳව හෝ තමන් වහන්සේ විසින් දේශනා කරන ලද හා පනවන ලද ධර්ම-විනය සම්බන්ධයෙන් කිසියම් හෝ ගැටළුවක් තිබේ නම් එය විමසා මේ අවස්ථාවේදී ම නිරාකරණය කරගන්නා ලෙසයි.

උන්වහන්සේගේ මෙම ප්‍රකාශනය ඔස්සේ බුදුදහම තුළ පවතින විමංසන නිදහස හෙවත් ප්‍රශ්න කිරීමේ, ගවේෂණය කිරීමේ අයිතිය මනාව පැහැදිලිවේ. මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ දී බුදුදහම, දේව සංකල්පය මූලික කොටගත් ආගමක් ලෙස කිසිදු විටෙකත් විග්‍රහ කළ නොහැකි බව පැහැදිලිය. එනමුත් "ආගම" යන වචන තුළින් සමාජ සදාචාරය ඇති කිරීම හා වර්ධනය කිරීම, මෙලොව හා පරලොව යහපැවැත්ම ගොඩනැංවීම් (උභයාර්ථ සාධනය) වැනි අර්ථ ඉස්මතු කරන්නනේ නම්, එනයින් ගත්කල බුදුදහම ද ආගමක් ලෙස හැඳින්වීමට හැකිය.

බුදුදහම යනු විශ්ව දහමකි. එය කිසිඳු ජාතියකට හෝ ආගමික කණ්ඩායමකට හෝ පමණක් අයත් නොවූවකි. එය මුළු විශ්වයට ම පොදු වූ දහමකි. බුදුදහමේ මූලික අරමුණ වන්නේ පුද්ගලයා හා සමාජය සම්බන්ධ සදාතනික ගැටළුවලට විසඳුම් සෙවීමයි. බුදුන් වහන්සේ විසින් අවබෝධ කරගන්නා ලද චතුරාර්ය සත්‍යය වූ කලී පුද්ගලයාගේ සිතේ හටගන්නා වූ දුක වටා ගොඩනැගුණු යථාර්ථය යි. එසේම බුදු දහමේ මූලික ඉගැන්වීමක් වන පටිච්චසමුප්පාද ධර්මය ඔස්සේ උගන්වා ඇත්තේ ද පුද්ගලයාට ඇතිවන දුක හේතුඵල ආකාරයෙන් ඇතිවීම සහ නැතිවීම සිදු වන ආකාරය යි. චතුරාර්ය සත්‍යය දේශනාවේ එන දුක්ඛ සත්‍යය යටතේ පුද්ගලයෙකු විසින් ස්වකීය ජීවිතය තුළ විඳිනු ලබන දුක් විස්තර කෙරෙන තැන "පියේහි විප්පයෝගෝ, අප්පියෙහි සම්පයෝගෝ" යනුවෙන් ප්‍රියයන්ගෙන් වෙන්වීම නිසාත්, අප්‍රියයන් සමග එකතුවීම නිසාත් ඇති වන දුක් ආකාර දෙක පෙන්වා දෙනු ලැබේ. මෙම මානසික දුක්ඛයන් විඳීමට සිදුවන්නේ බෞද්ධ ජනයාට පමණක්ම ද?. කතෝලික, ඉස්ලාම්, හින්දු ආදි අනෙකුත් ජාතිකයන්ට මෙම දුක් සිය ජීවිතය තුළ විඳීමට සිදු නොවන්නේ ද? එසේ නම් බුදුදහම තුළ සාකච්ඡා කෙරෙන්නේ ලෝකයේ යථා ස්වභාවය හා සමස්ත ලෝක සත්ත්වයා විසින් මුහුණපානු ලබන ගැටලු වන බවත්, එය ලෝකයෙහි ජීවත් වන සියලු දෙනා විසින් ම අත්දකින සහ අත්විඳිනු ලබන දේ බවත් පැහැදිලිය. මෙවැනි තත්ත්වයක් තුළ බුදුදහම බෞද්ධයන් නමින් පමණක් හැඳින්වෙන කොටසකට හෝ කණ්ඩායමකට සීමා මායිම් බැඳ කොටු කර තැබිය හැකි වන්නේද?. එසේ විශ්වයට ම පොදු වූ දහමක් කිසියම් එක් පිරිසකට පමණක් කොටු කර තබා ගැනීමට කිසිවිටෙකත් උත්සාහ නොකළ හැකි අතර යම් පිරිසක් උත්සාහ දරන්නේ නම් එය කෙතරම් අසාධාරණ හා අනර්ථකාරී උත්සාහයක් වන්නේ ද යන්න ඉහත පැහැදිළි කිරීමෙන් මනාව ගම්‍යමාන වනු ඇත. බුදුන් වහන්සේ තමන් විසින් අවබෝධ කොට ගත් දහම දේශනා කරනු ලැබුයේ ප්‍රඥාවන්තයන් සඳහා ම ය. එබැවින් ලොව සිටින සියලු ප්‍රඥාවන්තයින්ට මෙකී දහමින් ප්‍රයෝජනයට ගෙන ස්වකීය ලෞකික හා ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගැනීමට කිසිදු බාධාවක් නොමැත.


බුදුදහම ප්‍රඥාව අවදි කර ගැනීමේ මාර්ගය දක්වනු ලබන උතුම් දේශනාවකි. ප්‍රඥාවට පමණක් ම ගෝචර වන (පරම ගම්භීර) දැක්මක් එහි අන්තර්ගත වන අතර එතුළින් පුද්ගල ජීවිතයේ හා ලෝකයේ යථා ස්වභාවය මනාව පැහැදිළි කෙරේ. දම්සක්පැවතුම් සූත්‍රයෙහි "චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකෝ උදපාදි" යනුවෙන් දක්වා ඇති පරිදි බුදුදහම, ප්‍රඥාව උපදවා ගැනීම ආවසානික ඵලය කොටගත් දේශනාවකි. බුදුන්වහන්සේ ඉදිරිපත් කරන ලද මෙකී දර්ශනය තුළ කියවෙන්නේ සංසාර චක්‍රය නතර කිරීමට නම් පුද්ගලයා විසින් සන්තානගතව ඇතිවන දුක අවබෝධ කොටගෙන එම දුක් ඇතිවීමට හේතුව හඳුනාගත යුතු බවයි. දුක ඇතිවීමට හේතුව හඳුනා ගත් පසු කළ යුත්තේ දුක නැති කිරීම නොව දුක ඇතිවීමට හේතුව වූ තෘෂ්ණාව නැති කිරීමයි. එකී දුකට හේතුව වූ තෘෂ්ණාව නැති කිරීමේ මාර්ගය හෙවත් දුක නැති කිරීමේ මාර්ගය වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි. එම මාර්ගය වඩන, පුරුදු පුහුණු කරන ඕනෑම පුද්ගලයෙකුට දුක නැති කිරීමට හැකි වන අතර ඒ තුළින් අවිද්‍යාව දුරු කර විද්‍යාව හෙවත් ප්‍රඥාව පහළ කරගත හැකිවේ. එය නිවීමට පත් වීම හෙවත් නිර්වාණාවබෝධය ලෙස හැඳින්වේ.

මේ අනුව පැහැදිලි කෙරෙන්නේ බුදුන් වහන්සේ ලෝ වැසියන් වන අප කෙරෙහි මහත් කරුණාවෙන් පෙන්වා වදාරා ඇත්තේ අප නොදකින අපගේ ජීවිතයේ යථා ස්වභාවය වන බවයි. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද දහම වූ කලී ප්‍රායෝගිකව පුරුදු පුහුණු කර ප්‍රතිඵල ලැබිය යුතු දහමකි. නමුදු වර්තමානයේ ඇතැම් පිරිස් මේ උතුම් දහම් ශ්‍රවණය කොට සාධුනාද පමණක් පවත්වා බුදුදහමින් අපේක්ෂිත ප්‍රතිඵල බලාපොරොත්තුවේ. දහම ප්‍රායෝගිකව ස්වකීය ජීවිතයට බද්ධ කර නොගන්නා තාක්, දහම තමා තුළින් ප්‍රත්‍යක්ෂ කරගැනීමට (පච්චත්තං වේදිතබ්බං) කටයුතු කරගන්නා තාක් දහමෙහි සැබෑ ප්‍රතිඵල භුක්තිවිඳිය නොහැකිය. බුදුන්වහන්සේගේ ද ඇගයුමට නිරන්තරයෙන්ම ලක්වූයේ දහම ස්වකීය ජීවිතය තුළ ප්‍රායෝගිකව භාවිත කරනු ලබන පුද්ගලයා පමණි. තව ද වර්තමානයේ ධර්මානුධර්ම පටිපන්න වීමට වඩා ආමිසය කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වනු දැකිය හැකිය. එය ද බුදුදහමේ සැබෑ ප්‍රතිඵලය ලඟා කර ගැනීමට බාධාවක් වී ඇත. බුදුන්වහන්සේ විසින් ප්‍රමුඛතාවය ලබා දුන්නේ ආමිසයට නොව ප්‍රතිපත්ති පූජාවටයි. පිරිනිවන් මංචකයෙහි වැඩ සිටිමින් උන්වහන්සේ ස්වකීය භික්‍ෂු සංඝයා අමතමින් පවසා සිටියේ, "යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ ධර්මයට අනුකූලව පිළිපදින්නේ වෙයි ද, ධර්මයට මනාව පිළිපන්නේ වෙයි ද, ධර්මයට අනුකූලව හැසිරෙන්නේ වෙයි ද, (ධම්මානුධම්මපටිපන්නෝ සාමීචිපටිපන්නෝ අනුධම්මචාරී) ඔහු උතුම් පූජාවෙන් තථාගතයන් වහන්සේට සත්කාර කළා වන්නේය, ගරු කළා වන්නේය, බුහුමන් කළා වන්නේය, පූජා පැවැත්වුවා වන්නේය යනුවෙනි.

මහා පරිනිබ්බාන සූත්‍රයෙහි සඳහන් බුදුන් වහන්සේගේ මෙම ප්‍රකාශයෙන් උන්වහන්සේ මල්, පහන්, සුවඳ දුම්, ආහාර පාන ආදි පූජාවන් බලාපොරොත්තු නොවූ බව මනාව පැහැදිළිවේ. උන්වහන්සේ ස්වකීය ශ්‍රාවක පිරිසගෙන් අපේක්ෂා කරනු ලැබූවේ හුදෙක් ම ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදීම ය. මෙසේ බුදුදහම තුළ ප්‍රතිපත්ති පූජාවට ප්‍රමුඛත්වය ලබා දීම තුළින් ආමිස පූජාව ප්‍රතික්ෂේප නොකෙරේ. ආමිස පූජාව යනු, නිවන් නැමැති චූඩාමාණික්‍ය දරාසිටින දාගැබෙහි පාදම යි. ආමිස පූජාවෙන් තොරව ප්‍රතිපත්ති පූජාව සිදු කිරීම ඉතා දුෂ්කරය. ආමිසය තුළින් සිදු වන්නේ පුද්ගලයා තුළ ශ්‍රද්ධාව ගොඩනැගීමයි. ශ්‍රද්ධාව ගොඩනැගුණු පුද්ගලයා එකී ශ්‍රද්ධාව මත පිහිටා ලෝභ, ද්වේෂ, මෝහ දුරු කිරීමේ ප්‍රතිපදාව පුහුණු කිරීම ආරම්භ කරයි. එබැවින් ආමිස පූජාව ප්‍රතික්ෂේප කොට බුදුදහමේ ආවසානික ඵලය වෙත ළඟාවිය නොහැකිය. නමුදු වර්තමානයේ දැකිය හැකි බරපතල ගැටලුව වන්නේ, විවිධ නාමයන්ගෙන් විවිධ පූජා වර්ග පවත්වමින් එය ම නිවනට මග වන්නේ යැයි මිත්‍යා විශ්වාසයක් ඇතිව ආමිස පූජාවට ප්‍රමුඛතාවය ලබා දෙමින් කටයුතු කිරීමයි. ඒ හරහා බොහෝ දෙනෙකුට ප්‍රතිපත්ති පූජාව අත්හැරී ගොස් තිබේ. එය වනාහි නිවැරදි විය යුත්තකි. මන්දයත් බුදුන් වහන්සේ විසින් පෙන්වා දුන් සැබෑ සුවය, ශාන්තිය සාක්ෂාත් කොට ගත හැකි වන්නේ ආමිස පූජාව තුළින් ශ්‍රද්ධාව ගොඩනඟාගෙන ප්‍රතිපත්ති පූජාවට ප්‍රමුඛතාව ලබා දෙමින් කටයුතු කරන තරමට බැවිනි.

වර්තමාන සමාජය තුළ දැකිය හැකි තවත් ඛේදජනක ම කාරණයක් වන්නේ, මිනිසුන් දහම ප්‍රායෝගිකව ස්වකීය ජීවිතය තුළ ක්‍රියාත්මක කරමින් දහමින් සැලසෙන සැබෑ සුවය, සැනසිල්ල විඳීමට උත්සාහ නොකර විවිධ මිථ්‍යා සංකල්ප ඔස්සේ එකී සුවය, ශාන්තිය අපේක්ෂා කිරීමයි. මිනිස් ජීවිතේ දැවෙන ගැටලු සඳහා තිරසාර විසඳුමක් බුදුන් වහන්සේ විසින් තමන්වහන්සේ අවබෝධ කරගත් දහම තුළින් ඉදිරිපත් කර ඇතත් උන්වහන්සේ ඉදිරිපත්කරන ලද සැබෑ දර්ශන ඉස්මතු කොට ගෙන එය ස්වකීය ජීවිතයේ අභිවෘද්ධිය පිණිස යොදා ගැනීමට කටයුතු නොකිරීම ඉතා ඛේදජනකය. මේ උතුම්  වෙසග, බුදුන් වහන්සේ පෙන්වා වදාළ උතුම් දර්ශනය අවබෝධ කොට ගෙන ඒ හරහා තම ජීවිතයේ යථාර්ථය හා ලෝකයෙහි යථා ස්වභාවයක් මනාව දකිමින්, දැන ගනිමින් කටයුතු කිරීමට ඔබ සැමට ප්‍රඥාව පහළවේවා යැයි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි.

ගෞරව ශාස්ත්‍රවේදී, රාජකීය පණ්ඩිත
පූජ්‍ය බෝපැත්තේ සෝමානන්ද හිමි
කථිකාචාර්ය
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ගිහියෙකු ජීවත් විය යුතු පිළිවෙල.

අප ජීවත් වීමේ දී අප විසින් කළ යුත්තේ කුමක්ද? නොකළ යුත්තේ කුමක්ද? ඇසුරු කළ යුත්තේ කුමක්ද? ඇසුරු නොකළ යුත්තේ කුමක්ද? යන්න වටහා ගැනීමට තරමක් අපහසු අවස්ථා කොහෙතුත් එළඹී ඇත. මෙම ගැටලුවට පිළිතුරක් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට ඇත. මෙම බුද්ධ දේශනාව දීඝ නිකායේ, පාථික වර්ගයේ සඳහන් සිගාල නම් ගෘහපති පුත්‍රයාට දේශනා කළ සිගාල සූත්‍රයයි. මෙම බුද්ධ දේශනාව සිගාලෝවාද සූත්‍රය නමින් ප්‍රසිද්ධියටපත්ව ඇති අතර එහි අඩංගු ඇතැම් කරුණු නිතර අසන්නට ලැබේ. නමුත් සම්පූර්ණ සූත්‍ර දේශනාව කුමක් ද? යන්න ගැන අවබෝධයක් පැවතීම ගිහිව වසන අයට ජීවත් වීමේදී වැදගත් වේ. ඒ අනුව සිගාල සූත්‍රයෙහි සිංහල අරුත මෙම ලිපියෙන් දිග හැරෙයි.

''ගෘහපති පුත්‍රය, යම් කලෙක ආර්ය ශ්‍රාවකයාට සතර කර්ම ක්ලේශයෝ ප්‍රහීණවූවාහු වෙත් ද, සිව් තැනෙක්හි පාප කර්මයක් නොකරයි ද, භෝග සම්පත් විනාශ වෙන දොරටු සය සේවනයය නොකරයි ද, මෙසේ ඔහු දහහතරක් වූ පව් වලින් බැහැර වූයේ වෙයි ද, සය දිශාව වසා තැබූවේ වෙයි ද, දෙලොව ම ජය ගැනීම පිණිස පිළිපන්නේ වෙයි. ඔහු විසින් මෙලොව ද සතුටු කරන ලද්දේ වෙයි. පරලොව ද සතුටු කරන ලද්දේ වෙයි. ඔහු කය බිඳී මරණින් මතු සුගති සංඛ්‍යාත දෙව්ලොවෙහි උපදින්නේය.

සතර කර්ම ක්ලේශයෝ

ඔහුට කවර කර්මක්ලේශයෝ සතරක් ප්‍රහීණ වූවාහු වෙත් ද? ගෘහපති පුත්‍රය, සත්ව ඝාතනය වනාහී කිලිටි ක්‍රියාවකි. සොරකම කිලිටි ක්‍රියාවකි. කාමයෙහි වරදවා හැසිරීම කිලිටි ක්‍රියාවකි. බොරුකීම කිලිටි ක්‍රියාවකි. මොහුට සතරක් වූ මේ කර්මක්ලේශයෝ ප්‍රහීණ වූවාහු වෙති.'' භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාළ සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි මෙය ද වදාළ සේක.

සත්ව ඝාතනය, සොරකම, බොරු කීම යැයි කියනු ලැබේ නම්, එයත් අනුන්ගේ අඹුවන් කරා යාමත්, යන මේ කිලිටි ක්‍රියාවන් නුවණැත්තෝ ප්‍රශංසා නොකරති.

සිව් තැනෙක්හි පාප කර්ම

කවර නම් සිව් තැනක පාප ක්‍රියාවක් නොකරයි ද? පෘථග්ජන පුද්ගලයා කැමැත්ත නිසා අගතියට යෑමෙන් පාපී ක්‍රියාවන් කරයි. ද්වේෂය නිසා අගතියට යෑමෙන් පාපී ක්‍රියාවන් කරයි. මෝහය නිසා අගතියට යෑමෙන් පාපී ක්‍රියාවන් කරයි. භය නිසා අගතියට යෑමෙන් පාපී ක්‍රියාවන් කරයි. ගෘහපති පුත්‍රය, යම් හෙයකින් ආර්ය ශ්‍රාවකයා කැමැත්ත නිසා අගතියට නොයයි ද, ද්වේෂය නිසා අගතියට නොයයි ද මෝහය නිසා අගතියට නොයයි ද, භය නිසා අගතියට නොයයි ද, මේ සතර තැනෙහි පාපී ක්‍රියාවන් නොකරයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාළ සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි මෙය ද වදාළ සේක.

යමෙක් කැමැත්තෙන් වේවා. ද්වේෂයෙන් වේවා, මෝහයෙන් වේවා, භයෙන් වේවා සත්පුරුෂ ධර්මය ඉක්මවා යයි ද, කළුවර පක්ෂයෙහි ගෙවී ගෙන යන සඳක් සෙයින් ඔහුගේ යස පිරිවර පිරිහී යයි.

යමෙක් කැමැත්තෙන් වේවා, ද්වේෂයෙන් වේවා, මෝහයෙන් වේවා, භයෙන් වේවා සත්පුරුෂ ධර්මය ඉක්මවා නොයයි ද, පුර පක්ෂයෙහි වැඩීගෙන යන සඳක් සෙයින් ඔහුගේ යස පිරිවර වැඩෙයි.

භෝග සම්පත් විනාශ වෙන දොරටු සය

භෝග සම්පත් විනාශ වන කවර දොරටු සයක් ඔහු සේවනය නොකරයි ද? ගෘහපති පුත්‍රය, මත්වීමට ත් ප්‍රමාදවීමටත් හේතුවන මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය වනාහී භෝග සම්පත් විනාශ වන දොරටුවකි. අවේලාවෙහි වීදිගානේ ඇවිදීම භෝග සම්පත් විනාශ වන දොරටුවකි. නැටුම්, ගැයුම් ඇති තැන්. සමාජශාලා ආදියෙහි නිතර ගැවසීම භෝග සම්පත් විනාශ වන දොරටුවකි. ප්‍රමාදය ඇති කරවන සූදුවෙහි යෙදීම භෝග සම්පත් විනාශ වන දොරටුවකි. පවිටු මිතුරන් හා එක්ව කල් ගෙවීම භෝග සම්පත් විනාශ වන දොරටුවකි. කම්මැලිකමෙන් කල් ගෙවීම භෝග සම්පත් විනාශ වන දොරටුවකි.

ගෘහපති පුත්‍රය මත්වීමටත්, ප්‍රමාදයට ත් හේතුවන මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයෙහි යෙදී සිටීමෙහි මේ දුර්විපාක සයකි. තමාගේ ඇස් පනා පිට ධනය වැනසී යයි. කලකෝලාහල වැඩෙයි. රෝගයන් හට ගැනීමට මුල් වෙයි. අපකීර්තිය උපදවයි. කයෙහි වසාගත යුතු තැන් බාහිරට පෙන්වා හැසිරෙයි. නුවණ දුර්වල කරවීම සය වෙනි කරුණයි. ගෘහපති පුත්‍රය මේ වනාහී මත්වීමටත් , ප්‍රමාදයටත් හේතු වන මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඇති සයක් වූ දුර්විපාකයෝය.

ගෘහපති පුත්‍රය. අවේලාවෙහි වීදිගානේ ඇවිදීමෙහි මේ දුර්විපාක සයකි. ඔහු විසින් තමා ව ද පරිස්සම් නොකරන ලද්දේ වෙයි. ඔහු විසින් සිය අඹුදරුවෝ ත් පරිස්සම් නොරකින ලද්දාහු වෙති. ඔහු විසින් තමා ළඟ ඇති වටිනා දේ ද පරිස්සම් නොකරන ලද්දේ වෙයි. අන්‍යයන් විසින් කරනු ලබන පාපී කටයුතුවලදී මොහු ත් හවුල් කරුවෙක්දැයි සැක කරන්නේ වෙයි. අභූත චෝදනාවන්වලට ද ලක්වෙයි. බොහෝ දුක් ඇති කරදෙන කරුණු පෙරටු කරගත්තේ වෙයි. ගෘහපති පුත්‍රයෙනි, මේවා වනාහි අවේලාවෙහි වීදිගානේ ඇවිදීමෙහි ඇති සයක් වූ දුර්විපාකයෝ ය.

ගෘහපති පුත්‍රය, නැටුම් ගැයුම් ඇති සමාජශාලා ආදියෙහි නිතර හැසිරීමෙහි මේ දුර්විපාක සයකි. 'නැටුම් කොහි තිබේද? ගැයුම් කොහි තිබේද? වැයුම් කොහි තිබේද? නාට්‍ය සංදර්ශන කොහි තිබේද? අත්පොළසන් දෙමින් සතුටුවෙන ක්‍රීඩා උත්සව කොහි තිබේද? කළගෙඩියෙන් කරන සෙල්ලම් කොහි තිබේද? වශයෙන් එබඳු තැන් සොය සොයා කාලය ත්, ධනය ත් වනසා ගනියි. ගෘහපති පුත්‍රය, මේ වනාහි නැටුම් ගැයුම්, සමාජශාලා ආදියෙහි නිතර හැසිරීමෙහි ඇති සයක් වූ දුර්විපාකයෝ ය.

ගෘහපති පුත්‍රය, ප්‍රමාදයට හේතුවන සූදුවට ලොල් ව සිටීමෙහි මේ දුර්විපාක සයකි. ජයගත් විට පැරදුණු තැනැත්තා තුළ වෛරය උපදවයි. පැරදී ගිය විට නැතිවුණ වස්තුව ගැන ශෝක කරයි. තමාගේ ඇස් පනාපිට තම ධනය නැසී යයි. සභාවකට ගිය විට ඔහුගේ වචනයට තැනක් නොලැබෙයි. යහළු මිතුරන් ඔහු හෙලා දැක කතා කරයි. මේ පුරුෂ පුද්ගලයා සූදු අන්තුවෙකි. අඹු දරුවන් පෝෂණය කරන්නට නොහැක්කෙකි. වශයෙන් ආවාහ විවාහ කටයුතුවලදී නොපතන ලද්දේ වෙයි. ගෘහපති පුත්‍රය මේ වනාහි ප්‍රමාදයට හේතුවන සූදුවට ලොල් ව සිටීමෙහි සයක් වූ දුර්විපාකයෝය.

ගෘහපති පුත්‍රය, පවිටු මිතුරන් සමග එක් ව වාසය කිරීමෙහි මේ දුර්විපාක සයකි, මේ කෙනෙක් සූදු අන්තුවෝ වෙත් ද, ඔවුහු ඔහුගේ මිත්‍රයෝය. ඔහුගේ යහළුවෝය. යම් කෙනෙක් ස්ත්‍රී සල්ලාලයෝ ද, ඔවුහු ඔහුගේ මිත්‍රයෝය. ඔහුගේ යහළුවෝ ය. යම් කෙනෙක් බේබද්දෝ ද , ඔවුහු ඔහුගේ මිත්‍රයෝ ය. ඔහුගේ යහළුවෝ ය. යම් කෙනෙක් බොරුවෙන් රවටන්නෝ ද, ඔවුහු ඔහුගේ මිත්‍රයෝ ය, ඔහුගේ යහළුවෝ ය. යම් කෙනෙක් වංචාකාරයෝ ද, ඔවුහු ඔහුගේ මිත්‍රයෝ ය. ඔහුගේ යහළුවෝ ය. යම් කෙනෙක් සාහසික අපරාධකාරයෝ ද, ඔවුහු ඔහුගේ මිත්‍රයෝ ය, ඔහුගේ යහළුවෝ ය. ගෘහපති පුත්‍රය මේ වනාහි පවිටු මිතුරන් සමග එක්වීමෙහි ඇති සයක් වූ දුර්විපාකයෝ ය.

ගෘහපති පුත්‍රය කම්මැලි ව වාසය කිරීමෙහි මේ දුර්විපාක සයකි. සීතල අධික ය කියා වැඩ නොකරයි. උණුසුම අධික ය කියා වැඩ නොකරයි. බොහෝ සවස් වී ඇත්තේ ය කියා වැඩ නොකරයි. තව ම ඉතා උදෑසන ය කියා වැඩ නොකරයි. ඉතා බඩගිනි ඇත්තෙමි යි කියා වැඩ නොකරයි. බොහෝ කොට අනුභව කළෙම් යි කියා වැඩ නොකරයි. මෙසේ ඔහු විසින් කළ යුතු වැඩකටයුතු බහුල වශයෙන් අතපසු කරමින් වාසය කරන විට ඔහුට නූපන් භෝගයෝ ද නූපදිති. උපන් භෝගයෝ ද පරිහරණයෙන් අවසන් වී යති. ගෘහපති පුත්‍රය මේ වනාහි කම්මැලිව වාසය කිරීමෙහි ඇති සයක් වූ දුර්විපාකයෝ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාළ සුගත වූ ශාස්තෘන් වහන්සේ විසින් යළි මේ ගාථාවන් වදාළ සේක.

මත් පැන් බොන තැනදී පමණක් යහලු වූ යහලුවෙක, හමු වූ තැනදී පමණක් මිතුරුකම් අඟවන යහළුවෙක, වැඩ ඇති වූ කල්හි යමෙක් යහලු වේ ද එසේ වූ යහලුවෙක් ඇත.

හිරු උදාවන තෙක් නිදාගැනීම ද, අනුන්ගේ අඹුවන් ඇසුරු කිරීම ද, වෛර බහුලව සිටීම ද, අනුන්ට අයහපත කිරීම ද, පවිටු මිතුරන් ඇති බව ද, තද මසුරු බව ද යන මේ සය කරුණ පුරුෂයා විනාශයට පත් කරයි.

පව්ටු මිතුරන් සිටින, පව්ටු යහළුවන් සිටින, පාපී ඇවැතුම් පැවැතුම් ඇති මිනිසා මෙලොවත් වැනසෙයි. පරලොවත් වැනසෙයි.

සූදුවෙහි යෙදීම, අනුන්ගේ අඹුවන් ඇසුරු කිරීම, මත්පැන් බීම, නැටුම් සංගීත ක්‍රීඩා ආදිය සොය සොයා යෑම, දහවල් නිදා ගැනීම, අවේලාවෙහි වීදි ගානේ ඇවිදීම, පව්ටු මිතුරන් සිටීම ද, තද මසුරු බව යන මේ සය කරුණු පුරුෂයා විනාශයට පත් කරයි.

සූදු ක්‍රීඩාවෙහි යෙදෙති. සුරා බොති. තම පණ හා සමකොට රකින අනුන්ගේ අඹුවන් කරා යති. නිහීන පුද්ගලයන් ඇසුරු කරන ඔවුහු ගුණයෙන් වැඩුනවුන් ඇසුරට නොගනිති. ඔවුහු කලුවර පක්‍ෂයෙහි ගෙවී යන සඳක් සෙයින් පිරිහී යති.

යමෙක් ධනය කිසිවක් නැති ව, මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයට ලොල් ව සිටියි ද, පිපාසිතයෙක් පොකුණක් වෙත ගොස් පැන් බොන සෙයින් බේබදු ව සිටියි ද, ණය ගනියි ද, ඔහු වහා ම සිය පවුල පරිහානියට පත් වූ පවුලක් බවට පත් කරයි.

දහවල් නිදන්නා වූ, රෑ පිබිද සිටීම නොකැමති වූ, නිතර මත් වී සිටින, නරකට ඇබ්බැහි වූ තැනැත්තා හට ගිහිගෙයි වසන්නට නොහැක්කේය.

දැන් සීතල අධිකය, උණුසුම අධිකය. ඉතා සවස් වුයේ ය ආදී වශයෙන් සිය වැඩකටයුතු අත්හැර දැමූ මිනිසුන් පසුකොට ධන සම්පත් යයි.
යමෙක් මෙහිලා සීතල ත්, දැඩි උණුසුම ත් තණපතකට වත් වැඩි තරමකට ගණන් නොගෙන වීර්යවන්ත පුරුෂයෙකු කටයුතු කරන ලෙසින් වැඩ කරයි නම්, ඔහු සැපයෙන් බැහැරට නොයයි.
මිතුරන්ගේ වේශයෙන් සිටින මිතුරන්
ගෘහපති පුත්‍රය, මිතුරන්ගේ වේශයෙන් සිටින මිතුරන් නොවන මොවුන් සතර දෙනා දත යුත්තාහුය. අඤ්ඤදත්ථුහර නමින් මිතුරෙකුගේ වෙසින් සිටින මිතුරෙකු නොවන්නා දත යුත්තේ ය. වචීපරම නමින් මිතුරෙකුගේ වෙසින් සිටින මිතුරෙකු නොවන්නා දත යුත්තේ ය. අනුප්පියභාණී නමින් මිතුරෙකුගේ වෙසින් සිටින මිතුරෙකු නොවන්නා දත යුත්තේ ය. අපායසහාය නමින් මිතුරෙකුගේ වෙසින් සිටින මිතුරෙකු නොවන්නා දත යුත්තේ ය.
ගෘහපති පුත්‍රය, මිතුරෙකුගේ වෙසින් සිටින අඤ්ඤදත්ථුහර අමිත්‍රයා සිව් කරුණකින් දැන ගත යුත්තේ ය.

සිය මිතුරාගෙන් ඒකාන්තයෙන් ම කිසිවක් ඩැහැගෙන ම යයි. ස්වල්ප දෙයක් දී සිය මිතුරාගෙන් බොහෝ දෙයක් ගන්නට කැමැති ය. තමාට භයක්, කරදරයක් වූ විට පමණක් මිතුරාට උදව් පිණිස එයි. තමාගේ ම ලාභ ප්‍රයෝජන උදෙසා මිතුරුකම පවත්වයි.
ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් මිතුරු වෙසින් සිටින අඤ්ඤදත්ථුහර අමිත්‍රයා දැනගත යුත්තේ ය.
ගෘහපති පුත්‍රය, මිතුරෙකුගේ වෙසින් සිටින වචීපරම අමිත්‍රයා සිව් කරුණකින් දැනගත යුත්තේ ය. ( කලින් කිව්වා නම් මේ උදව්ව කළ හැකි ව තිබුණේ ය ආදී වශයෙන්) අතීතයෙන් සංග්‍රහ කරයි. (ඉදිරියෙහි දී ඔබ වෙනුවෙන් මෙබඳු දේ කරන්නෙමි ආදී වශයෙන් ) අනාගතයෙන් සංග්‍රහ කරයි. නිරර්ථක වචන වලින් බොරු සංග්‍රහ කරයි. වර්තමානයේ උදව්වක් අවශ්‍ය වූ විට උදව් දෙනු වෙනුවට තමාට සිදු වූ විපත් කරදර කියා පායි. ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් මිතුරු වෙසින් සිටින වචීපරම අමිත්‍රයා දැනගත යුත්තේ ය.
ගෘහපති පුත්‍රය, සිව් කරුණකින් මිතුරෙකුගේ වෙසින් සිටින අනුප්පියභාණී අමිත්‍රයා දැනගත යුත්තේ ය. තම යහළුවා කරන පාපී ක්‍රියාවන් මැනැවැ යි අනුමත කරයි. ඔහුගේ යහපත් ක්‍රියාවන් ද මැනැවැයි අනුමත කරයි.

යහළුවා ඉදිරියෙහි ප්‍රශංසා මුඛයෙන් කථා කරයි. ඔහු නැති විට ඔහුගේ නුගුණ කියයි. ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් මිතුරෙකුගේ වෙසින් සිටින අනුප්පියභාණී අමිත්‍රයා දැනගත යුත්තේ ය.

ගෘහපති පුත්‍රය, සිව් කරුණකින් මිතුරෙකුගේ වෙසින් සිටින අපායසහාය අමිත්‍රයා දත යුත්තේ ය. මත් වීමට හා ප්‍රමාදයට හේතුවන මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය වෙනුවෙන් හිතවත් වෙයි. අවේලාවෙහි වීදි ගානේ ඇවිදින්නට හිතවත් වෙයි. සංගීත නාටක ක්‍රීඩා සමාජශාලා ආදියෙහි ගැවසෙන්නට හිතවත් වෙයි. ප්‍රමාදයට හේතුවන සූදු ක්‍රීඩාවෙහි යෙදෙන්නට හිතවත් වෙයි. ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් මිතුරෙකුගේ වෙසින් සිටින අපායසහාය අමිත්‍රයා දැනගත යුත්තේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාළ සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි මෙය ද වදාළ සේක.

අඤ්ඤදත්ථුහර නම් යම් මිතුරෙක් වෙයි ද, වචීපරම නම් යම් මිතුරෙක් වෙයි ද, අනුප්පියභාණී නම් යම් මිතුරෙක් වෙයි ද, ධන විනාශයට උදව් දෙන අපාය සහාය නම් යම් මිතුරෙක් වෙයි ද, නුවණැත්තා මේ සිව් දෙනා මිතුරන් නොවන බව තේරුම් ගෙන භය සහිත මාර්ගයක් දුරු කරන කෙනෙකු සෙයින් දුරින් ම දුරු කරන්නේ ය.
සුහද මිතුරෝ සිව් දෙනා
ගෘහපති පුත්‍රය, මේ සුහද මිතුරෝ සිව් දෙනා දත යුත්තාහු ය. උපකාරී නම් සුහද මිතුරා දත යුත්තේ ය. සමානසුඛදුක්ඛ නම් සුහද මිතුරා දත යුත්තේය. අත්ථක්ඛායී නම් සුහද මිතුරා දත යුත්තේ ය. ආනුකම්පක නම් සුහද මිතුරා දත යුත්තේ ය.
ගෘහපති පුත්‍රය, සිව් කරුණකින් උපකාරී නම් සුහද මිතුරා දැකගත යුත්තේ ය. ප්‍රමාදයට පත් වූ මිතුරා ව රකියි. පමා වූ මිතුරා සතු වටිනා දේ ත් රකියි. බියක් පැමිණි විට මිතුරාට පිහිට වෙයි. මිතුරාට කළ යුතු දෙයක් ඇති කල්හි ඊට අවශ්‍ය පමණට ත් වඩා දෙගුණයක් සම්පත් දෙයි. ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් උපකාරී සුහද මිතුරා දැනගත යුත්තේ ය.
ගෘහපති පුත්‍රය, සිව් කරුණකින් සමානසුඛදුක්ඛ නම් සුහද මිතුරා දත යුත්තේ ය. හේ තමාගේ පෞද්ගලික දේ සිය මිතුරාට නොසඟවා කියයි. මිතුරාගේ පෞද්ගලික කරුණු පිටතට නොදී සුරකියි. මිතුරා විපතට පත් වූ විට අත්නොහරියි. මිතුරාගේ යහපත පිණිස සිය ජීවිතය වුවත් පුදන්නට කැමැති වෙයි. ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් සමානසුඛදුක්ඛ සුහද මිතුරා දැනගත යුත්තේ ය.

ගෘහපති පුත්‍රය, සිව් කරුණකින් අත්ථක්ඛායි නම් සුහද මිතුරා දත යුත්තේ ය. හේ සිය මිතුරා ව පවින් වළක්වයි. පිනෙහි යොදවයි. නොඇසූ ධර්මය අසන්නට සලස්වයි. දෙව්ලොවට මග කියා දෙයි. ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් අත්ථක්කායි සුහද මිතුරා දැනගත යුත්තේ ය.

ගෘහපති පුත්‍රය, සිව් කරුණකින් ආනුකම්පක නම් සුහද මිතුරා දත යුත්තේ ය. හේ සිය මිතුරාගේ පිරිහීම ගැන නොසතුටු වෙයි. දියුණු ව ගැන සතුටු වෙයි. අන්‍යයන් විසින් සිය මිතුරාගේ නුගුණ කියන විට එය වළක්වයි. මිතුරාගේ ගුණ කියන්නාට පසසයි. ගෘහපති පුත්‍රය, මේ සිව් කරුණෙන් ආනුකම්පක සුහද මිතුරා දැනගත යුත්තේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාළ සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි මෙය ද වදාළ සේක.

යම් මිතුරෙක් උපකාරී නම් වෙයි ද, යම් මිතුරෙක් සැප දුකෙහි සම වෙයි ද, යම් මිතුරෙක් දෙලොව යහපත සළසයි ද, යම් මිතුරෙක් අනුකම්පා කරයි ද, නුවණැත්තා මෙසේ මේ මිතුරන් සිව් දෙනා හඳුනාගෙන තම කුසෙහි උපන් පුතුට සළකන මවක සෙයින් සකස් කොට ඇසුරු කළ යුත්තේ ය.

සිල්වත් නුවණැති තැනැත්තා දිලෙන ගින්නක් සෙයින් බබලයි. මල් පැණි රැස් කරනා බඹරෙකු සෙයින් ධාර්මිකව භෝග සම්පත් රැස් කරන්නාගේ වස්තුව තුඹසක් බඳින පරිද්දෙන් භෝග සම්පත් වඩ වඩා රැස් වී යයි.



ඒක් භෝග සම්පත් කොටසක් තමාගේ පරිහරණයට යොදවයි. දෙකොටසක් සිය ව්‍යාපාරයන්ට යොදවයි. විපත්වලදී පිහිටවන්නේ යැයි ඒ වෙනුවෙන් සිව්වෙනි කොටස තැන්පත් කරන්නේ ය.
සය දිශාව ගෘහපති පුත්‍රය. ආර්ය ශ්‍රාවකයා සය දිශාව වසා තබන්නේ කෙසේද? ගෘහපති පුත්‍රය. මේ සදිසාවෝ දත යුත්තාහු ය. පූර්ව දිශාව යනු මව්පියෝ යැයි දතයුත්තාහු ය. දකුණු දිශාව යනු ගුරුවරු යැයි දත යුත්තාහුය. බටහිර දිශාව යනු අඹුදරුවෝ යැයි දතයුත්තාහු ය. උතුරු දිශාව යනු යහළු මිත්‍රයෝ යැයි දත යුත්තාහු ය. යට දිශාව දාස කම්කරුවෝ යැයි දත යුත්තාහු ය. උඩ දිශාව ශ්‍රමණ බ්‍රාහ්මණයෝ යැයි දත යුත්තානු ය.

ගෘහපති පුත්‍රය, පුත්‍රයෙකු විසින් පූර්ව දිශාව වූ මව්පියෝ පස් කරුණකින් උපස්ථාන කළ යුත්තාහුය. මව්පියන් විසින් හැදූ වැඩූ මම මහළු වූ කල ඔවුන්ව රැකබලා ගන්නෙමි යි . මව්පියන්ට කළ යුතු දෙයක් ඇති කල්හි කරදෙන්නෙමි යි. මව්පියන්ගේ කුලපරපුර ඒ අයුරින් තබා ගන්නෙමි යි. මව්පියන්ගෙන් ලද දායාදය හිසි අයුරින් පරිහරණය කරන්නෙමි යි එමෙන්ම මව්පියන් මියගිය පසු දන් පැන් පුදා ඔවුන්ට පින් පෙත් දෙන්නෙමි යි. ගෘහපති පුත්‍රය, පුත්‍රයෙකු විසින් පූර්ව දිශාව වූ මව්පියෝ මේ පස් කරුණෙන් උවැටන් කරනු ලබන්නාහු පස් කරුණකින් සිය පුත්‍රයාට ඔවුහු අනුකම්පා කරති. පවින් වළක්වති. පිනෙහි යොදවති. ශිල්ප ශාස්ත්‍රාදියෙහි පුහුණු කරවති. ගැලපෙන ස්ත්‍රියක හා සම්බන්ධ කරවති. සුදුසු අවස්ථාවහි දායාදය පවරති. ගෘහපති පුත්‍රය, පුත්‍රයා විසින් පූර්ව දිශාව වූ මව්පියෝ මේ පස් කරුණින් උවටැන් කරන ලද්දාහු යථෝක්ත පස් කරුණෙන් සිය පුතුට අනුකම්පා කරති. මෙසේ ඔහු විසින් මේ පූර්ව දිශාව අනතුරු නොවන අයුරින් රැකවරණයෙන් යුක්ත ව භය රහිත ව වසා තබන ලද්දේ වෙයි.

ගෘහපති පුත්‍රය, ශිෂ්‍යයෙකු විසින් දකුණු දිශාව වූ ගුරුවරයෝ පස් කරුණකින් උවටැන් කළ යුත්තාහුය. ගුරුවරු දැක හුනස්නෙන් නැගිටීමෙන් ද, ගුරුවරුන්ට උපස්ථාන කිරීමෙන් ද, ගුරුවරුන් උගන්වන දෑ හොඳින් ඇසීමෙන් ද, ගුරුවරුන්ට වතාවත් කිරීමෙන් ද , ගුරුවරුන් උගන්වන ශිල්පාදිය සකස් කොට ඉගෙන ගැනීමෙන් ද වශයෙනි.
ගෘහපති පුත්‍රය, ශිෂ්‍යයෙකු විසින් දකුණු දිශාව වූ ගුරුවරයෝ මේ පස් කරුණෙන් උවටැන් කරන ලද්දාහු පස් කරුණකින් සිය ශිෂ්‍යයාට අනුකම්පා කරති. මනා හික්මවීමකට හික්මවති. මනාකොට ගනු ලැබුවක් සෙයින් ශිල්ප උගන්වති. ගුරුවරුන් අසා ඇති සියළු ශිල්ප මැනැවින් කියා දෙති. ගුරුවරුන්ගේ විශේෂ යහළු මිතුරන්ට හඳුන්වා දෙති. දිශාවන්හි රැකවරණය සළස්වති. ගෘහපති පුත්‍රය, ශිෂ්‍යයා විසින් දකුණු දිශාව නම් වූ ගුරුවරයෝ මේ පස් කරුණෙන් උවටැන් කරන ලද්දාහු මේ පස් කරුණෙන් සිය සිසුවාට අනුකම්පා කරති. මෙසේ ඔහු විසින් මේ දකුණු දිශාව අනතුරු නොවන ලෙස රැකවරණයෙන් යුක්ත ව , භය රහිත ව වසා තබන ලද්දේ වෙයි.

ගෘහපති පුත්‍රය, සැමියා විසින් බටහිර දිශාව වූ බිරිඳ පස් කරුණකින් උපස්ථාන කළ යුත්තේය. ගරුසරු දක්වා කථා කිරීමෙන් ද , අවමන් කොට කථා නොකිරීමෙන් ද, සිය බිරිඳ ප්‍රධානත්වය දීමෙන් ද, තමාට ශක්ති පමණින් ඇඳුම් ආයිත්තම් ආදිය මිලට ගෙන ඇයට තෑගි කිරීමෙන් ද, ගෘහපති පුත්‍රය, මේ පස් කරුණෙන් සැමියා විසින් බටහිර දිශාව වූ බිරිඳට උවටැන් කරන ලද්දේ ඕ තොමෝ සැමියාට ද පස් කරුණකින් අනුකම්පා කරයි. කලට වේලාවට ආහාරපාන සකස් කරදීම්ආදිය කර දෙයි. සේවකකාරකාදීන්ට යහපත් ව සලකයි. සිය සැමියා ඉක්මවා වෙනත් පුරුෂයන් කරා නොයයි. සිය සැමියා රැස් කළ ධනය රකියි. සියළු කටයුතුව ලදී කම්මැලි නැති ව දක්ෂ වෙයි. ගෘහපති පුත්‍රය, සැමියා විසින් බටහිර දිශාව වූ බිරිඳ මේ පස් කරුණෙන් උවටැන් කරන ලද්දී, යථෝක්ත පස් කරුණෙන් සිය සැමියාට ඕ තොමෝ අනුකම්පා කරයි. මෙසේ ඔහු විසින් මේ බටහිර දිශාව අනතුරු නොවන ලෙස රැකවරණයෙන් යුක්ත ව , භය රහිත ව වසා තබන ලද්දේ වෙයි.

ගෘහපති පුත්‍රය, කුලපුත්‍රයා විසින් උතුරු දිශාව වූ යහළු මිතුරෝ පස් කරුණකින් උවටැන් කළ යුත්තාහු ය. දානයෙන් ය. ප්‍රිය වචනයෙන් ය. ධනෝපායන මාර්ගයන්ට උදව් කිරීමෙන් ය. සමාන සැලකීමෙන් ය. නොරැවටීමෙන් ය. ගෘහපති පුත්‍රය, කුලපුත්‍රයෙකු විසින් උතුරු දිශාව වූ යහළු මිතුරෝ මෙකී පස් කරුණෙන් උවටැන් කරනු ලබන්නාහු, පස් කරුණෙකින් ඔවුහු එම කුලපුත්‍රයාට අනුකම්පා කරති. පමා වූ විට රකිති. පමා වූ මිතුරාගේ වටිනා දේ රකිති. බියක් හටගත් විට පිහිට වෙති. විපතක දී අත් නොහරිති. මිතුරාගේ පවුලේ දූ දරුවන් ආදීන්ට ද සලකති.

ගෘහපති පුත්‍රය, කුලපුත්‍රයා විසින් උතුරු දිශාව වූ යහළු මිත්‍රයෝ මේ පස් කරුණෙන් උවටැන් කරන ලදුව ඔවුහු යථෝක්ත පස් කරුණෙන් එම කුලපුත්‍රයාට අනුකම්පා කරති. මෙසේ ඔහු විසින් මේ උතුරු දිශාව අනතුරු නොවන ලෙස රැකවරණයෙන් යුක්ත ව, භය රහිත ව වසා තබන ලද්දේ වෙයි.ගෘහපති පුත්‍රය, ස්වාමියා විසින් යට දිශාව වූ දාස කම්කරුවෝ පස් කරුණකින් උපස්ථාන කළ යුත්තාහු ය. ඔවුන්ගේ හැකියාවන්ට ඔරොත්තු දෙන ලෙස වැඩකටයුතු පැවරීමෙන් ද, ආහාරපාන වැටුප් ආදිය යහපත් ලෙස දීමෙන් ද, ඔවුන් අසනීප වූ විට විශේෂ උපකාර ලබාදීමෙන් ද, විශේෂ රසවත් දේවල් ඔවුන් සමඟ බෙදා හදා ගැනීමෙන් ද, අවශ්‍ය අවස්ථාවන් හි දී සේවකයින්ට නිවාඩු ලබා දීමෙන් ද වශයෙනි. ගෘහපති පුත්‍රය, ස්වාමියෙකු විසින් යට දිශාව වූ දාස කම්කරුවෝ මේ පස් කරුණෙන් උවටැන් කරනු ලබන්නා හු, පස් කරුණකින් ඔවුහු සිය ස්වාමියාට අනුකම්පා කරති. නියමිත වේලාවට ත් කලින් ම නැගිට වැඩ කටයුතු සඳහා සූදානම් වෙති. හැමට පසුව නින්දට යන තෙක් ම වැඩෙහි යෙදී සිටිති. දුන් දේ පමණක් ගනිති. (සොරකම් නොකරති) ඉතා හොඳින් සිය සේවා කටයුතු කරති. ස්වාමියාගේ හොඳ නම සිය කැමැත්තෙන් පතුරුවති. ගෘහපති පුත්‍රය, ස්වාමියා විසින් යට දිශාව වූ දාස කම්කරුවෝ මේ පස් කරුණෙන් උවටැන් කරන ලදු ව ඔවුහු යථෝක්ත පස් කරුණෙන් සිය ස්වාමියාට අනුකම්පා කරති. මෙසේ ඔහු විසින් මේ යට දිශාව අනතුරු නොවන ලෙස රැකවරණයෙන් යුක්ත ව, භය රහිත ව වසා තබන ලද්දේ වෙයි.
ගෘහපති පුත්‍රය, කුලපුත්‍රයා විසින් උඩ දිශාව වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පස් කරුණකින් උවටැන් කළ යුත්තාහු ය. මෛත්‍රී කාය කර්මයෙන් ය. මෛත්‍රී වචී කර්මයෙන් ය. මෛත්‍රී මනෝ කර්මයෙන් ය. සිය නිවෙස්හි දොරටු නොවසා තැබීමෙන් ද, සිව්පසයෙන් උපස්ථාන කිරීමෙන් ද වශයෙනි. ගෘහපති පුත්‍රය, කුලපුත්‍රයෙකු විසින් උඩ දිශාව වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මේ පස් කරුණෙන් උවටැන් කරනු ලබන්නාහු ඔවුහු සය කරුණකින් කුලපුත්‍රයාට අනුකම්පා කරති. පවින් වළක්වති. පිනෙහි යොදවති. යහපත් සිතින් අනුග්‍රහ කරති. නොඇසූ ධර්මයන් අසන්නට සළස්වති. ඇසූ ධර්මයන් පිරිසිදු කරදෙති. දෙව්ලොවට මාර්ගය පවසති. ගෘහපති පුත්‍රය, කුලපුත්‍රයා විසින් උඩ දිශාව වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මේ පස් කරුණෙන් උවටැන් කරන ලදුව ඔවුහු යථෝක්ත සය කරුණෙන් කුලපුත්‍රයාට අනුකම්පා කරති. මෙසේ ඔහු විසින් මේ උඩ දිශාව අනතුරු නොවන ලෙස රැකවරණයෙන් යුක්ත ව , භය රහිත ව, වසා දමන ලද්දේ වෙයි.
භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාළ සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි මෙය ද වදාළ සේක.
පෙරදිග යනු මව්පියෝ ය. දකුණු දිග යනු ගුරුවරුය. අවරදිග යනු අඹුදරුවෝ ය. උතුරු දිග යනු යහළු මිතුරෝ ය. යටදිග යනු දාස කම්කරුවෝ ය. උඩ දිශාව යනු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ය. ගිහි ගෙදර වසන්නට දක්ෂ වූ ගිහියා මේ දිශාවන් නමදින්නේ ය.

නුවණැති , සිල්වත්, සියුම් අරුත් දන්නා, වැටහෙන නුවණැති, යටහත් පැවතුම් ඇති, ඕලාරික ගතිගුණ නැති, එබඳු තැනැත්තා යස පිරිවර ලබයි. නැගී සිටිනා වීර්ය ඇති, කම්මැලි නැති, විපත්වලදී නොසැලෙන, නොකඩ කොට යහපත් පිළිවෙත් පවත්වන , සොඳුරු නුවණැති එබඳු තැනැත්තා යස පිරිවර ලබයි.
සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කරන, මිතුරන්ට යහපත සලසන, අනුන් විසින් උදව් ඉල්ලන්නට සුදුසු වූ, මසුරුමල දුරුකළ , අන් අයට යහපත පෙන්වන, යහපතෙහි හික්මවන, නැවත නැවත යහපත පෙන්වන එබඳු තැනැත්තා යස පිරිවර ලබයි.

මෙහි දානයත් ප්‍රිය වචනයත්, අර්ථ චර්යාවත් යන යමක් ඇද්ද . එය ඒ ඒ පුද්ගලයා කෙරෙහි ධර්මානුකූල ව සුදුසු පරිදි සමාන බව පවත්වත් ද, යන මෙයින් යුක්ත වූ කල්හි ගමන් කරන රථයෙහි ඇණය මෙන් මේවා ලොවෙහි සංග්‍රහයෝ ය. මේ සංග්‍රහයයෝ ලොව නොතිබෙත් නම් පුතුගේ ක්‍රියාවෙන් මව් හෝ පුතුගේ ක්‍රියාවෙන් පියා හෝ බුහුමනක් හෝ පූජාවක් හෝ නොලබන්නේ ය. යම් හෙයකින් නැණවත්හු මේ සංග්‍රහ කළ යුතු කරුණු මැනවින් දැනගත්තාහු ද, එහෙයින් උදාර බවට පත් වෙති. ඔවුහු ලොව පැසසුමට ලක්වෙති.

එච්.එම්.එල් ගුණසේකර
කථිකාචාර්ය
මූලය අධ්‍යයන අංශය



# සීලය, පුද්ගලයා සහ සමාජය

කය වචනය සහ සිත යන දොරටු තුනෙන් අපගේ සියලු ක්‍රියා සිදු වන බව බුදු දහම පෙන්වා දෙයි. සිත මගින් මේ සියලු ක්‍රියා පාලනය වේ. එහෙත් සමාජය සමඟ සම්බන්ධතා සෘජුව පවත්වා ගනු ලබන්නේ කතා කරන වචන හා කායික ක්‍රියා මගිනි. මේ දොරටු දෙක සංවර කර ගැනීම සීලය නමින් හැඳින්වේ. පුද්ගලයාගේත් සමාජයේත් යහපතට හේතුවන පරිදි චර්යා හා වචන හසුරුවා ගැනීම එයින් අදහස් කරනු ලැබේ.

සීලය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? සීලයෙහි ප්‍රධාන අංශ දෙකකි. තමන්ටත් අන්‍යයන්ටත් අහිතකර හා වැඩදායි නොවන කායික හා වාචසික ක්‍රියාවන්ගෙන් වැළකීම එක් අංශයකි. විරමණය නම් එයයි. බොහෝවිට පන්සිල් ආදී ශික්ෂා පද-වලින් අවධාරණය වන්නේ යමකින් වැළකීම ගැන ය. හිතකර වැඩදායි ක්‍රියාවන්හි යෙදීම අනික් අංශයයි. සමාදානය නමින් එය හැඳින්වේ. සෑම ශික්ෂාපදයකම මේ අංශ දෙකම ඇතුලත් වේ. සීලයෙහි පුද්ගලයා හා බැඳුණු අංශයක්ද සමාජය හා බැඳුණු අංශයක්ද යනුවෙන් අංශ දෙකක් තිබේ. සීලය පුද්ගලයාගේ දියුණුව කෙරෙහි ද සමාජයේ දියුණුව කෙරෙහි ද බලපාන ආකාරය දැන් විමසා බලමු.

දියුණුව නොයෙක් ආකාරයට අරුත් දැක්විය හැකි වචනයකි. පුද්ගලයෙකුගේ දියුණුව මූලික වශයෙන් භෞතික දියුණුව හා අධ්‍යාත්මික දියුණුව යනුවෙන් අංශ දෙකකට බෙදා දැක්විය හැකිය. එයින් භෞතික දියුණුවෙහිද විවිධ අංශ ඇත. ආර්ථික දියුණුව එකකි. සමාජ සම්බන්ධතාවන්ගේ දියුණුව තවත් එකකි. මානසිකව ලබන දියුණුව අධ්‍යාත්මික දියුණුවෙහි ලක්ෂණයකි.විමුක්ති මගට අවතීර්ණ වීම ද අධ්‍යාත්මික දියුණුවය. සිල්වත් වීමේ ප්‍රයෝගික ප්‍රයෝජන පහක් බුදුරජාණන් වහන්සේ විසින් ලෝක සත්ත්වයාට දේශනා කළ වදාළ සේක .

සිල්වත් තැනැත්තා අප්‍රමාද වීමේ හේතුවෙන් ධනය වැඩි කර ගන්නා බව පළමු කරුණය. අප්‍රමාද වීම යන්නෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ ප්‍රමාද නොවීමය. එහෙත් එහි ඊට වැඩි ගැඹුරු අදහසක් තිබේ. එනම් මුළා නොවීම යන්නයි. සිහි ඇතිව වැඩ කිරීම එහි සැබෑ අරුතයි. සාමාන්‍යයෙන් සිදුවන ප්‍රමාදයන්ටද හේතුව සිහි ඇතිව තම කටයුතුවල නො යෙදීමයි.

සිල්වත් බව ධනවත් වීමට බාධාවක් යැයි සිතන්නෝ අප අතර සිටිති. මෙහිදී බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ සිල්වත් වීම ධනවත් වීමට හේතු වන බවයි.

ඒ කෙසේ සිදුවේ ද? මේ සඳහා පන්සිල් පද වලින් පස්වැන්න මදක් විමසීම ප්‍රයෝජනවත් වෙයි. ප්‍රමාදයට හේතු වන නිසා සුරාමේරය මජ්ජ යනුවෙන් හැඳින්වෙන අතර මත්පැන් හා මත්ද්‍රව්‍ය වලින් වෙන් වීමට ඉටා ගැනීම එම ශික්ෂා පදයෙන් සිදුවේ. ධන

පරිහානියට හේතු වන ක්‍රම හයක් ගැන සිඟාලෝවාද සූත්‍රයේ ධන විනාශ මුඛ පිළිබඳ විස්තරයෙන් පැහැදිලි වේ. මත්පැන් හා මත්ද්‍රව්‍ය ගැනීමට පුරුදු වූ තැනැත්තාට ඒවා මිලදී ගැනීම සඳහා යන වියදම හේතුවෙන් සිදුවන්නේ ධන විනාශයයි. මතට ඇබ්බැහි නොවූ තැනැත්තාට මේ වියදම නැත.

විවිධාකාර රෝගාබාධවලට ගොදුරු වීම සුරාවට හෝ මත්ද්‍රව්‍ය ගැනීමට ඇබ්බැහි වූවකුට වියදම් යන තව ක්‍රමයකි. සිරෝසිස් වැනි රෝග බොහෝ විට සුරාව නිසාම වැළඳේ. එවැනි රෝගියෙකුගේ කාය ශක්තිය ද මුදල් හා කාලය ද නිකරුණේ වැය වන ආකාරය පිළිබඳ නිදසුන් සමාජයේ එමට ය. මත්පැන් මත්ද්‍රව්‍ය ආදියට ඇබ්බැහි වූවන්ට මේ වියදම් නැත. මෙසේ නිරර්ථක වියදම් නැති වීම සිල්වතා ධනවතෙක් බවට පත්වන එක් ආකාරයකි.

විවිධාකාර රෝගාබාධවලට ගොදුරු වීම සුරාවට හෝ මත්ද්‍රව්‍ය ගැනීමට ඇබ්බැහි වූවකුට වියදම් යන තව ක්‍රමයකි. සිරෝසිස් වැනි රෝග බොහෝ විට සුරාව නිසාම වැළඳේ. එවැනි රෝගියෙකුගේ කාය ශක්තිය ද මුදල් හා කාලය ද නිකරුණේ වැය වන ආකාරය පිළිබඳ නිදසුන් සමාජයේ එමට ය. මත්පැන් මත්ද්‍රව්‍ය ආදියට ඇබ්බැහි වූවන්ට මේ වියදම් නැත. මෙසේ නිරර්ථක වියදම් නැති වීම සිල්වතා ධනවතෙක් බවට පත්වන එක් ආකාරයකි.

විශ්වාස කළ හැකි අයකු වීම වෙළෙන්දෙකුට, ව්‍යාපාරිකයෙකුට හෝ ශිල්පියෙකුට ස්වකීය දියුණුව සඳහා අතිශයින්ම අවශ්‍යය. කෙනෙකුට බැංකු ණයක් ගත හැක්කේ විශ්වාසය මතය.

ව්‍යාපාරික ස්ථානයකට පාරිභෝගිකයන් පැමිණෙන්නේ එහි නියමිත ප්‍රමිතීන්ට අනුකූල භාණ්ඩ වෙළදාම් කරන බවට ඇති විශ්වාසය මතය. මේ අනුව බලන කළ යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට නම් පුද්ගලයා විශ්වාස කළ හැකි අයෙකු විය යුතුය. මෙම ගුණධර්ම තම ජීවිතයට සම්බන්ධ කර ගැනීම සිල්වත් වීමකි. සිහි නුවණින් යුතු ව කළුරිය කිරීම ද මරණින් පසු හොඳ තැනක උපත ලැබීම ද ශීලයෙහි තවත් අනුසස් දෙකකි.

ආර්යය මාර්ගයේ මුල් පියවර සීලයයි. සීලය සමාධියට මගපාදයි. සීලය හා සමාධිය සම්පූර්ණ වීමෙන් ප්‍රඥාව ලබා ගත හැක්කේය. ප්‍රඥාව ලබා ගැනීම අධ්‍යාත්මික සංවර්ධනයේ ඉහළම පියවරය.එමගින් පැහැදිලිවන්නේ සීලය නිසා පුද්ගලයාගේ භෞතික දියුණුව සැලසෙන අතර අධ්‍යාත්මික දියුණුවටද මග පෑදෙන බවයි.

සීලය සමාජයේ දියුණුවට හේතු වේ.සමාජය දියුණු වන්නේ ප්‍රධාන වශයෙන් ම මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා වන්නේ නම් පමණකි. මූලික මිනිස් අයිතිවාසිකම් කීපයක් සෑම සමාජයක් විසින් ම හඳුනාගෙන තිබේ. ඒවා මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයෙහිද ඇතුළත් කොට ඇත. ඒ අතර ජීවත් වීමේ අයිතිය, වදහිංසා වලින් තොරව ජීවිත ගත කිරීමට ඇති අයිතිය, පොදු හා පෞද්ගලික දේපළ භුක්ති විඳීමේ අයිතිය, බාධකවලින් තොර පවුලක් ගොඩනගා ගැනීමේ අයිතිය හා සත්‍යය ප්‍රකාශ කිරීමේ අයිතිය වඩාත් වැදගත් ලෙස අවධාරණය කරන අයිතිවාසිකම් ය.

බෞද්ධයකු වශයෙන් ආරක්ෂා කළ යුතු පංච පංචශීලයෙහි පළමුවැන්න ජීවත්වීමේ අයිතිය පිළිගැනීමයි. මෙහි දී බෞද්ධයා සාමාන්‍ය මිනිසුන්ගේ පොදු පිළිගැනීමෙන් ඔබ්බට ගොස් මිනිසාගේ මෙන්ම සතුන්ගේ ද ජීවත්වීමේ අයිතිය පිළිගනී. මරා දමති යන බියෙන් හෝ සැකයෙන් තොරව මිනිසාටත් සතුන්ටත් ජිවත් වීමට උචිත පරිසරයක්, ප්‍රාණඝාතයෙන් වෙන් වීමේ පළමු ශික්ෂා පදය සමාදන් වන තැනැත්තා නිසා තහවුරු වේ.මිනිස්සු මෙන්ම සත්තු ද දඬුවමට බිය වෙති. හිංසාවට හා පීඩාවට ලක් වීමට අකමැති වෙති. බෞද්ධයා ආරක්ෂා කිරීමට පොරොන්දු වන පළමුවන ශික්ෂා පදයෙන් මිනිසුන්ගේ හා සතුන්ගේ මේ අපේක්ෂාව ද පිළිගැනේ. හිංසාවෙන්, දඬුවමෙන් තොර සමාජයක් එයින් සහතික කරයි.

පෞද්ගලිකව ද පොදුවේ ද දේපළ පරිහරණය කිරීම මිනිසාට අවශ්‍යයය. තමාගේ දේ සොරකම් කරති හෝ පැහැරගෙන තියෙතියි බියෙන් සමාජයක ජීවත් වීම අපහසුය. සොරසතුරන්ගෙන් තොර සමාජ ක්‍රමයකට බෞද්ධයාගේ දෙවන ශික්ෂා පදය මගින් මග හෙළි කරනු ලැබේ. අන් සතු දේ නොගැනීමේ සිල්පදය රැකීම දේපල ආරක්ෂාවට දෙන සහතිකයකි.

බාධා රහිත පවුල් ජීවිතයක් ගොඩනගා ගැනීමට මිනිසාට ඇති අයිතිය, කාමයෙහි වරදවා නොහැසිරීම පොරොන්දු වන තුන්වන ශික්ෂා පදයෙන් තහවුරු කරන මිනිස් අයිතිවාසිකමකි. නිවසක් තනාගෙන දිවි ගෙවන අඹුසැමි යුවළකට ස්ථාවර පැවැත්මක් තිබීම අනිවාර්යයය. ඔවුහු තම ශක්ති පමණින් ගේ දොර ඉඩකඩම් බඩු භාණ්ඩ සපයාගෙන දරුවන් පෝෂණය කරමින් සදාචාරාත්මක ජීවන රටාවකට හුරු වී සිටි. පවුලක වැඩිහිටියන් වේවා, වැඩිවිය පත්වූ දරුවන් වේවා සමාජ විරෝධී අනියම් සබඳතා ගොඩනගා ගතහොත් පවුල නමැති සමාජ සංස්ථාව බිඳ වැටේ. වර්තමාන සමාජයේ දෙමව්පිය සෙනෙහස අහිමි වූ අනාථ දරුවන්, ගණිකාවන්, විවිධ දුශ්චරිත වල යෙදෙන්නන් බහුල වී ඇත්තේ එක් අතකින් කාමමිථ්‍යාචාරය නිසා යැයි ද කිව හැකිය. එපමණක් නොව තමන්ටත් තම පවුලේ සාමාජිකයන්ටත් සමාජයටත් මහත් තර්ජනයක් වන මාරාන්තික ඒඩ්ස් රෝගය වැනි භයානක සමාජ රෝග ඇති වීමට ප්‍රධාන හේතුවද මෙයයි. තුන්වන ශික්ෂා පදය රකින සමාජයක මේ ප්‍රශ්න කිසිවක් උද්ගත වීමට ඉඩක් නැත.

ජන සමාජයේ විවිධ අංශ මැනවින් පවත්වා ගැනීම සඳහා විනයක් අවශ්‍යයය. සත්‍ය වචනය එම විනය පවත්වා ගැනීමේ වැදගත් මාර්ගයකි. බොරු කීම හා බොරු සාක්ෂි දීම බරපතල වැරදි ලෙස සලකන අධිකරණය එම වරදට සිර දඬුවම් පවා නියම කරන්නේ එබැවිනි. මුසාවාදය හෙවත් බොරුව රජකරන සමාජය පරිහානිය කරා ගමන් කරයි. අන්තර් පුද්ගල සබඳතා එයින් බිඳවැටී මුසාවාද සන්නිවේදනය ද වර්තමානයේ ඉතා බලවත් සමාජ ප්‍රශ්නයක් වී තිබේ. මිනිසුන් මුලාකරන ප්‍රචාරණ විධි අද බොහෝ සෙයින් බලවත්ය. එවැනි තත්ත්වයකින් සමාජය ගොඩනැගීමට නම් සතර වන ශික්ෂා පදය අනිවාර්යයෙන් ම ආරක්ෂා විය යුතුය.

ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දෙන පස්වන ශික්ෂා පදයෙන් බෞද්ධයා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඈත්වෙයි. ධන විනාශයට, රෝගාබාධ ඇතිවීමට, අපකීර්තියට පත් වීමට, නුවණ දුර්වල වීමට හා නිර්ලජ්ජිත හැසිරීම් වලට හේතු වන මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඈත් වීම සමාජ දියුණුවට මග පාදයි. රැකියා ස්ථානයන්හි වැඩ ප්‍රමාදයට, නිවසේ කලකෝලාහල ඇති වීමට, සමාජ සදාචාරය හා නීති රීති බිඳ වැටීමට, මාර්ග අනතුරු බහුල වීමට, තමන්ගේ දරුවන්ට පවා නිවසේ ආරක්ෂාව නැති වීමට හා ගෙදරටද රටටද බරක් වීමට එක් ප්‍රධාන හේතුවක් වී ඇත්තේ මිනිසා මතට ඇබ්බැහි වීමයි.මතින් තොර රටක යථෝක්ත සමාජ ප්‍රශ්න බොහෝ සෙයින් අඩුය.

මූලික වශයෙන් පන්සිල් පමණක් ආරක්ෂා වන සමාජයකට ලබාගත් හැකි දියුණුව මෙපමණක් කරුණු සලකා බැලීමෙන් වුවද වටහාගත හැකිය. බෞද්ධ වුවත් නැතත් මේ කරුණු නිසි ලෙස ඉටු කිරීම ශිෂ්ට මිනිසාගෙන් සිදුවිය යුත්තකි. නීතිගරුක සමාජයක් වන්නේ එවැන්නකි. සීලය පුද්ගලයාගේ දියුණුවට මෙන්ම සමාජයේ දියුණුවට හේතු වන බව මේ අනුව නිගමනය කළ හැකි ය.

සී.එච්.එච්.කේ.එස්.ඩී.හේරත්
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# වෙසක් සිරිය.

ජීවිතයේ අනියත බව තණ අග පිණි වැන්නේ
අද සිටියා හෙට කොතනද නැත කිසිවෙකු දන්නේ
බුදු දහමේ කර්මයමයි කළ පව් ඵල දෙන්නේ
තෙමඟුල අසිරිය වෙසගේ නිවසෙම සැමරෙන්නේ

රහසින් වත් පව් නොකරන බුදු හිමිගේ සෙවණේ
මෙත් කරුණා දයා ගුණේ පිරි ඉතිරී තිබුණේ
තුනුරුවනේ බල මහිමෙන් අප සැම රැක දෙන්නේ
වෙසක් සිරිය හද බැතියෙන් තෙමඟුල සමරන්නේ

නිල තල බල තණ්හාවෙන් සිත ඈතට යන්නයි
යහ ගුණ පිරි දැහැමි හැඟුම් හද තුල ඉතිරෙන්නයි
තුනුරුවනේ පන්සිල් පද හැම දෙන රැකගන්නයි
හෙළ රට දැය සමය රකින සුබ වෙසගක් වෙන්නයි

දැවෙන හැඟුම් පහවී ගොස් සැනසුම ගෙන දෙන්නයි
හදවත් තුල දුක දුරු වී බුදු බණ සිහි වෙන්නයි
ලෝකෙම තුන් බිය දුරු වී සිත සුවපත් වෙන්නයි
මේ වෙසගේ කොයි කාටත් සුව සෙත සැලසෙන්නයි

සිටියා නම් යහ ගුණ පිරි හොද මිනිසුන් ලෙසිනේ
හිතුවා නම් අටලෝ දම් ගැන නිසි ලෙසිනේ
පිදුවා නම් හැකි තරමක් දං පිං යහ සිතිනේ
එනවා මයි පිහිටට බුදු හිමි තෙරුවන් සරණේ

බිගුන් යශින්ත
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# පින්බර වෙසක් දිනය

පින්බර වෙසක් සඳ පායා එනුබ කුසේ
විහිදෙන රැස් කිරණ ලොව සැමතැනම දිසේ
දෙව් ඇරයුමෙන් මහමායා බිසව කුසේ
පිළිසිඳගත් සේක සිදුහත් කුමරු මෙසේ

වෙසඟ දිනේ සිදුහත් බෝසත් සමිඳ
බිහිවූයේ ලුම්බිණි උයනේ නොවෙද
ලොවම එළිය කළ එම දිනයේ නොමඳ
පායා තිබුණි වෙසගේ පුන් පොහොය සඳ

ඉපදී මෙලොව ඇති උපරිම සැප වින්දා
ගිහිගෙය නිසරු බව වටහාගත් හින්දා
ගිහිගෙය හැර ගියා අප බෝසත් සමිඳා
කෙලෙසුන් මරු පැරදවිය බුදුබව කැන්දා

දුක්විඳි සත්ත්වයින් සසරින් ගොඩ ගන්න
ජීවිතයේ සත්‍යම වටහා දුන්න
අප බුදුපියාණනි ඔබ හා සම වෙන්න
අන් කෙනෙකුන් නොමැත මේ ලොව බිහි වෙන්න

මගෙ බුදුපියාණන් තිලොවට අග හින්දා
සදහම් සිසිලසින් ලොව නැහැවූ හින්දා
අසරණ දනා සසරෙන් ගැලවූ හින්දා
දොහොත් මුදුන් දී මම ඔබහට වැන්දා

එල්.නෙත්මි කාවින්ද්‍යා ද සිල්වා
පළමු වසර
මූල්‍ය අධ්‍යන අංශය

# බුදු හිමි දුටු විශ්වය

අද වන විට නූතන විද්‍යා ක්ෂේත්‍රයේ විශාලතම ආයෝජන සිදුකරන ක්ෂේත්‍රයක් ලෙස විශ්ව ගවේශණය දැක්විය හැකිය. ලොව රාජ්‍ය ආයතන මෙන්ම පුද්ගලික ආයතනද මේ තරඟයට එක් වී ඇත. අද නූතන විද්‍යාත්මක ප්‍රවේශ වලට අනුව සොයා ගන්නා තොරතුරු වසර 2566 කට පෙර බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කර ඇත. බුදු දහම අනිත්‍ය මත පදනම් වූ දහමක් යැයි අදහස් දක්වන්නන්ට එසේ නොවන බව විදහා දැක්වීමටද මෙය හොඳම ප්‍රවේශයකි.

ලෝවැසි සත්ත්වයා සසර දුකින් ගලවා ගැනීම උදෙසා ධර්මය දේශනා කරමින් සිය ජීවිත කාලය ගත කළ බුදුන් වහන්සේ විශ්වයේ ස්වභාවය ද ඉතා මැනවින් දත් සේක. බුදුරදුන්ගේ අගසව් දෙනමගෙන් අයෙකු වූ මුගලන් මහතෙරුන් වහන්සේ විශ්වය පිළිබඳව උනන්දුවක් දැක් වූ අයෙකි. විශ්වය ගවේශණය කොට අවසන් කිරීම, මිනිසාට තම ජීවිත කාලය තුළ දී කිසි දිනකත් නිමා කිරීමට නොහැකි වන බව දක්වමින් බුදුන් වහන්සේ මුගලන් තෙරුන්ට අවවාද දුන් නමුත් මුගලන් තෙරුන් ධ්‍යාන බලයෙන් විශ්වයේ සැරිසරා අතරමං වූ පසු බුදුන් වහන්සේ මුගලන් තෙරුන්ව ධ්‍යානයෙන් මුදවා ගලවා ගත්හ. විශ්වයේ අනන්ත වූ ප්‍රමාණාත්වය මෙයින් පැහැදිලි වේ.

නවීන විද්‍යාව විශ්වයේ ප්‍රමාණය කොටස් තුනකට බෙදා දැක්වූ ලෙසම අදින් සියවස් 25 කට ඉහත දී ගෞතම බුදුන් වහන්සේද විශ්වයේ ප්‍රමාණය කොටස් 3 කට බෙදා දැක් වූ අන්දම අංගුත්තර නිකායේ තික නිපාතයේ ආනන්ද වග්ගයේ චූලනිකා සූත්‍රයෙහි දී දැක්වේ.

1) සහස්සි (චූලනී) ලෝක ධාතු
2) ද්වි සහස්සි (මධ්‍යම) ලෝක ධාතු
3) ත්‍රී සහස්සී (මහා) ලෝක ධාතු

නවීන විද්‍යාවට අනුව පෘථිවිය, එය අයත් සූර්යයා වටා පරිභ්‍රමණය වන්නකි. එම සූර්යයාට, තමන් වටා පරිභ්‍රමණය වන ග්‍රහලෝක නමයක් ද ඒවාට අයත් චන්ද්‍රයන් යනාදී, ග්‍රහවස්තු වලින් ද සමන්විත වේ. මේ ප්‍රමාණය (සූර්යයා හා ග්‍රහ මණ්ඩලය) සෞරග්‍රහ මණ්ඩලය ලෙස හඳුන්වයි.

වර්තමාන තාරකා විද්‍යාඥයින්ගේ සොයා ගැනීම් වලට අනුව අප අයත් සෞරග්‍රහ මණ්ඩලය පිහිටා තිබෙන්නේ සර්පිලාකාර හැඩයක් සහිත මන්දාකිණියේ වාටියේ මැද කොටසක ය. මන්දාකිණියක් තුල සූර්යයන් හා ග්‍රහලෝක කෝටි සංඛ්‍යාවක් අඩංගු වේ. මේ එක් සූර්යයෙක් හා ග්‍රහලොවක් එය අයත් මන්දාකිණියේ මධ්‍යය වටා චක්‍රාකාර ගමන් මාර්ගයක ගමන් කරයි. පැයට සැතපුම් හතලිස් ලක්ෂයක වේගයෙන් චක්‍රාවාටයේ මධ්‍යය ලක්ෂය වටා හිරු, සඳු, පෘථිවිය යනා දී ග්‍රහවස්තූන්ට එක් වටයක් ගමන් කිරීමට අවුරුදු විසි ලක්ෂයක් ගත වේ.

තථාගතයන් වහන්සේ විසින් (ගෞතම බුදුන් වහන්සේ) නවීන විද්‍යාවෙන් අනාවරණය කරගෙන තිබෙන විශ්වයේ ස්වභාවය දැනට සියවස් 25කට ඉහත දී ඉතා මැනවින් විස්තර කර තිබූ බව සූත්‍රාගත කරුණු විමර්ශනය කිරීමේ දී පැහැදිලිව පෙනී යයි. බුදුරජානන් වහන්සේ විශ්වයේ ස්වභාවය පිළිබඳව පැවසූ සියල්ල ඉතා මැනවින් විද්‍යානුකූල සොයා ගැනීම් වලට ගැලපෙන බව ද කිව යුතු ය. තථාගත විස්තරයෙහි දැක්වෙන්නේ නවීන විද්‍යාවෙන් ඔබ්බට ද විහිදී ගියා වූ පැහැදිලි කිරීමකි. පෘථිවිය අයත් සූර්යයා ග්‍රහ මණ්ඩලයේ ස්වභාවය තථාගතයන් වහන්සේ පෙන්වා දුන් එක් අවස්ථාවක් සංයුක්ත නිකායේ අරුණවතී සූත්‍ර දේශනාවෙහි සඳහන් වී තිබේ.

"යාවතා ආනන්ද චන්දිම සුරියා පරිහරන්ති දිසා ගන්ති විරොචනා තාව සහස්සධා ලෝකො"

සඳ හා හිරු දිසාවන් ආලෝකවත් කරමින් කෙතරම් දුරක් සැරිසරත් ද(කෙතරම් දුරක් චක්‍රාකාරව ගමන් කරන්නේද?) එම ආලෝකය විහිදී යන ප්‍රදේශය, එය දහස් සංඛ්‍යාත ලෝක ධාතුවකි.

නවීන විද්‍යාත්මක සොයාගැනීම් සමග මෙම විස්තර ඉතා මැනවින් ගැලපේ. හිරු, සඳු පෘථිවිය යනාදී ග්‍රහවස්තූන් චක්‍රාවාටයේ මධ්‍ය වටා සර්පිලාකාර ගමන් මාර්ගයක ගමන් ගනී. බුදු දහමට අනුව හිරු සඳු ආලෝකය විහිදුවමින් යම්තාක් දුර ගමන් කරයි ද එය දහස් සංඛ්‍යාත ග්‍රහ වස්තු වලින් සමන්විත ලෝක ධාතුවකි. එනම් මන්දාකිණියකි.

විශ්වයක ආරම්භය හා අවසානය

සප්ත සූර්යද්ගමන සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, චක්‍රවර්ති සූත්‍ර වල සඳහන් වන ආකාරයට විශ්වයක් හෝ ලෝකයක් ගත කරන්නා වූ කාලය අවස්ථා 3ක් යටතේ විග්‍රහ කල හැක.

1) අන්තඃකල්ප
2) අසංඛ්‍ය කල්ප
3) මහා කල්ප

මෙම කල්ප වලට අයත් වන්නා වූ කාලය, මිනිස් සිතෙන් සිතා ගැනීමටත් අසීරු වන්නා වූ ඉතා දීර්ඝ කාලයන් වේ. වර්තමාන විද්‍යාත්මක අනාවරණයන්ට අනුව පෘථිවිය බිහිවීමට අවුරුදු කෝටි ගණනාවක්ද, පෘථිවිය මත ජීවයට සුදුසු පරිසරයක් සකස් වීමට තවත් අවුරුදු කෝටි ගණනාවක් ද, සත්ත්ව වර්ගයාගේ ආරම්භය හා විකාශනයට අවුරුදු කෝටි ගණනාවක් ද ගත වී තිබේ. එය ද සැලකිල්ලට ගනිමින් මෙම ඉතා දීර්ඝ කාල වකවානු පිළිබඳව සිතා ගත යුතු ය.

ඉහත දැක්වූ මහා කල්පයක කාලය පිළිබඳ අවබෝධ කරගත හැකි උපමාවක් පහතින් දැක්වේ.

"සෙය්‍යථාපි භික්ඛු ආයසං නගරං යොජනං අයාමෙන යොජන විත්ථාරෙන යොජනංනං උබ්බේධෙන පුණ්ණං සාසපානං චූලිකෙන තතො පුරිසො වස්ස සතස්ස වස්ස සතස්ස අච්චයෙන එකමෙකං සාසපං උද්ධරෙය්‍ය. ඛිප්පතරං ඛො සො භික්ඛු මහා සාසපරාසි. ඉමිනා උපක්කමෙන පරික්ඛ. පරියාදානං ගච්ඡෙය්‍ය. නත්වෙව කප්පො."

මහණෙනි දිග, පළල, උස යොදුන බැගින් වූ කොටුවකට අබ ඇට පුරවා වර්ෂ 100 කට වරක් එක අබ ඇටය බැගින් ඉවත් කොට එම ඇට ඉවර වුවත් කල්පයකට අයත් වන අවුරුදු ගණන නිමා නොවේ.

අන්තඃකල්පයක කාලය

මිනිසුන්ගේ ආයුෂ අවුරුදු 10 සිට ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙමින් අවුරුදු අසංඛ්‍ය දක්වා දීර්ඝ වී නැවතත් ක්‍රම ක්‍රමයෙන් අවුරුදු දහය දක්වා අඩු වීමට ගත වන්නා වූ කාලය අන්තඃකල්පයක කාලය ලෙස දැක්වේ.අන්තඃකල්ප (20) ක් ගත වූ විට අසංඛ්‍ය කල්පයක් වේ.

මහා කල්පයක් තුළ බුදුවරයෙකු ලොව පහළ විය හැකිය. අනාගත වංශ කතාවේ සඳහන් වන ආකාරයට එක් මහා කල්පයක් තුල බුදුවරු පස්නමක් බුද්ධත්වයට පත්වුවහොත් එම මහා කල්පය මහා භද්‍ර කල්පයක් ලෙස හඳුන්වයි. (එක් කල්පයක් තුළ බුදුන් වහන්සේලා පහල වන උපරිම ගණන ද පහකි)

ලෝක විනාශය

මහා කල්පයකට වරක් ලෝක විනාශයක් සිදුවේ. ස්වභාව ධර්මයෙන් සකස් වූ ලෝකය ස්වභාව ධර්මයෙන්ම විනාශ වන්නේය. එම විනාශයේ දී කෝටි ලක්ෂයක් සක්වළ විනාශ වන බව සඳහන් වේ (සප්ත සූර්යෝද්ගමන සූත්‍රය) ගින්නෙන්, ජලයෙන්, වාතයෙන් යන ත්‍රිවිධාකාරයෙන් ලෝකය විනාශ වේ. ප්‍රථමයෙන් සත්වරක් ගින්නෙන් විනාශ වේ. අටවැනි වර ජලයෙන් විනාශ වේ. මේ ආකාරයෙන් (63) වරක් විනාශ වූ විට සැටහතර වෙනි වාරයේ දී වාතයෙන් විනාශ වී යයි. වර්තමානයේ ලෝකය ගත කරන්නේ විවට්ටට්ඨායි අසංඛ්‍යයට අයත් කාලයේයි. මෙම අසංඛ්‍යට අයත් කාලය අවසානයෙහි ලෝක විනාශයක් සිදුවීමට නියමිත වේ.

යම් විශ්වයක් හෝ ලෝකයක් යුග සතරක් ගත කරන බව අග්ගඤ්ඤ සූත්‍රයෙන් පෙන්වා දෙයි. එනම්,

1) සංවට්ට අසංඛ්‍ය
2) සංවට්ටට්ඨායි අසංඛ්‍ය
3) විවට්ට අසංඛ්‍ය
4) විවට්ටට්ඨායි අසංඛ්‍ය

මෙම යුග සතර එක් වූ විට කාලය මහා කල්පයක් ලෙස දැක්වේ.

01. සංවට්ට අසංඛ්‍ය

විශ්වය හෝ ලෝකය විනාශ වීමට (හැකිලීමට) පටන් ගන්නා යුගය. (විශ්වයේ උපරිම සංවර්ධනයට ලඟා වූ පසු විශ්වය ක්‍රියාත්මක වන්නා වූ ශක්තිය නිමාවට පත් වේ. එතැන් පටන් නැවත විශ්වය හැකිලීමට පටන් ගනු ඇත.

02. සංවට්ටට්ඨායි අසංඛ්‍ය

විශ්වය හෝ ලෝකයේ සියලු ද්‍රව්‍යයන් විනාශ වී ගිය පසු අධික ඝණාන්ධකාරයෙන් යුක්තව පවතින කාලය, විශ්වය විනාශව පවතින අවස්ථාව.

03. විවට්ට අසංඛ්‍ය

විශ්වය හෝ ලෝකය නැවත ආරම්භ වීමට පටන් ගන්නා කාලය.

04. විවට්ටට්ඨායි අසංඛ්‍ය

විශ්වය හෝ ලෝකය ආරම්භ වී නැවත යෙදෙන්නා වූ විනාශය තෙක් එහි පූර්ණත්වය තෙක් සෑදෙමින් ගමන් ගන්නා කාලය මෙය විශ්වය ප්‍රසාරණය වෙමින් පවත්නා කාලයයි.

වර්තමානයේ ලෝකය හෝ විශ්වය ගත කරමින් පසුවන්නේ මෙයින් සිවුවැනි (විවට්ට කල්පය තුළ) අවස්ථාවේ බව බෞද්ධ ඉගැන්වීමයි. විශ්වයේ උපත හා අවසානය පිළිබඳව නූතන විද්‍යාඥයන් තවමත් විවිධ මත පලකරති. දනට ඒ සම්බන්ධයෙන් සොයාගෙන තිබෙන්නා වූ කරුණු මගින් විශ්වයේ සංවට්ටමාන, සංවට්ට හා විවට්ටමාන යන අනෙකුත් යුග තුන පිළිබඳව කරුණු සනාථ වෙමින් පවතින බව කිව යුතු ය. විශ්වය ප්‍රසාරණය වීමෙන් අනතුරුව හැකිලීමට පටන් ගන්නා යුගය එළෙඹෙන බවට විද්‍යාඥයන් බොහෝ දෙනෙකුම විද්‍යාත්මක ගණන් ගැනීම් වලට අනුව පෙන්වා දී තිබේ.

නවීන විද්‍යාවෙන් තවමත් හරි හැටි අනාවරණය කර නොගත් කරුණු පවා බුදුන් වහන්සේ මැනවින් දැන ලෝකයාට දේශනා කර තිබෙන අන්දම මේ අනුව පැහැදිලි වේ. අනාගතයේ යම් දිනක විශ්වයේ සම්භවය පිළිබඳව මෙයට වඩා කරුණු විද්‍යාඥයන් විසින් අනාවරණය කරගත් දිනක බුදුන් වහන්සේ දේශනා කල ධර්ම කරුණු තව තවත් බැබළෙමින් තහවුරු වන බව නම් පැහැදිලි සත්‍යයකි.

එම්.පසිඳු ලක්ෂාන් පෙරේරා
ප්‍රථම වසර
මූලය අධ්‍යයන අංශය

# අම්බලමක නැවතුමක්


විඩාබර ගමනකට හමුවුණා තාවකාලික නැවතුමක්
මොහොතකට කල් ගෙවන එක්තරා හංදියක්
නානාවිධ ආයිත්තම් මන්ද මහ මෙර තරම්
නමුදු අම්බලම විය මොහොතකට සුරලොවක්

කල්ප ගණනක් නොදැන යන දිගු මාවතක්
බව දනිමි හොඳටම
තව කොපමණ දුරක් යන්න ඇත්දැයි නොදැනුවත්
බව දනිමි හොඳටම
ගණන් කරගත නොහැකි තරමට අම්බලම් හමුවුණා එතරමට
දුක සතුට පිරී හැඟුම් මුසු වෙමින්
ගතකලා එතුළ

අම්බලමට එද්දි හිතුණෙ ඉක්මනින් යන්නම් හිතාගෙන
ආයෙ යන්නට හිතක් දෙන්නෑ මන්ද නොදනිමි පිලිතුරක් නැත
මඳ වෙලාවක කරන ආයිත්තම් පිරී ඇත අහස මුදුනට
ඒවා අතරමග නතර කර යා යුතුව ඇත වෙන අම්බලමකට

කල්ප ගණනක් නොදැන එන මේ සංසාරික දිවි මග අසීරුය
හැඳින ගෙන මේ ලබන කෙටි උපතකට නිසි අගයක් ලබාගෙන
හැකි ලෙසින් මේ  අම්බලම බඳු තවකාලික බවය තුලදීම
කල්ගෙවමු ලං කර ගැනීමට නිර්වාණය යන උතුම් අරමුණ

එන්.ආර්.ජයරත්න
පළමු වසර
මූල්‍ය අධ්‍යයන



රාගක්ඛයෝ නිබ්බානං .....
ද්වේෂක්ඛයෝ නිබ්බානං .....
මෝහක්ඛයෝ නිබ්බානං .....

මෝහ අන්ධකාරයෙන් පිරි ඝෝර සසරේ,
මෛත්‍රිය බැහැර කොට,
රාග, ද්වේශ, පුරමින්,
ලෝක සත්ත්වයෝ ගමන් කරනුයේ කුමක් අරභයාද ... ?
සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා සපුරමින්,
තුන් ලෝ වාසින් දුකින් මුදවනු පිණිස,
අති උත්තම වූ,
අනුත්තර වූ,
ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ,
තම අසමසම වූ සර්වඥතා ඥානයෙන්,
ලෝක සත්ත්වයන්ට විවර කර දුන්,
සදාකාලික දුකින් එතෙර වීමේ
ඒකායන නිර්වාණ මාර්ගය පසෙකලා,
ඔවුන් මේ සොයනුයේ සැබෑ සත්‍ය සුවයමද ... ?

සත්‍ය පිරිහෙමින් යන ලෝක ධාතුවේ, පංචනීවරණයන් බැහැර කොට සත්‍ය සුවය අවබෝධ කරගැනීමට, ප්‍රඥාලෝකය උදාවන සුපින්බර වෙසක් මංගල්‍යයක් වේවා !!!

භාග්‍යා රාජපක්ෂ
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# රාහුල මතා වරුණ

සැම සුව පහසු යස ඉසුරින් පිරී ගිය
සුවහස් මැඳුරු තලයේ සොඳ සයන මත
වැතිරී කඳුළු සලමින් නුඹ රුව සොයන
හිමියනි මමයි රාහුලගේ මව් තුමිය

මානෙල් අට මිටක් පුද විවරණ ලැබුව
බුදු වන බවය දක්වා පසුපස සරන
ආත්මීය ප්‍රේමයෙ සුව සොයාගෙන
හිමියනි මමයි සිදුහත්ගෙ ප්‍රියාවිය

මන්ත්‍රී දේවි ලෙස දරුවන් දන් දුන්න
පතිවත බලෙන් සඳකිඳුරුට දිවි දුන්න
කඳුලැල් දරා නුඹ අරමුණ සවි කෙරුව
හිමියනි මමයි රාහුලගේ මව් තුමිය

අවැසි නමුත් නුඹ වෙත තව රැඳීමට
මා දැන් දනිමි හිමියනි නුඹ යා යුතුය
සියලු  සතන් හට සුව සෙත සැලීමට
නුඹ යන මඟට මල් ඇතිරිලි පතමි මම

පල වැල සියල්ලෙම රස ගුණ ඉතිරේවා
දාහය නිවන රැල් දහරා ඇති වේවා
කර්කශ පොළව හිම මෙන් පිරිසිඳු වේවා
මගේ හිමි සඳුගෙ සැම අදිටන ඉටු වේවා

දරනෙමි ලයේ ඉතිරෙන හැම රිදුමක්ම
පතනෙමි නුඹේ සුභ සෙත සැම මොහොතෙහිම
නිවන් මගේ රන් දොරගුළු විවර කොට
මල් මී වැනි දහම් ලොව වෙත බෙදනු මැන

සඳදිනුදා ලියනආරච්චි
මූල්‍ය අධ්‍යන අංශය
පළමු වසර




සංජය ලක්ෂාන්
මූල්‍ය අධ්‍යයන අංශය
පළමු වසර

# කිතුනුවකුගේ ඇසින් තෙමඟුලේ අසිරිය

යන මග අතර මව්පිය තැන දැක ගන්න
ඇස ගැටුණේ මහා මායාවට ලුම්බිණි සල් උයන
දරු ගැබ හඬනවා කුස තුළ බැහැ ඉවසන්න
වට කර සල් උයනේ ඈ බිහි කළේ පුතු මතු බුදු වන්න

සත්පියුමන් මත පා පියවර තබමින් පෙරට
මතු ලොව අග්‍ර වන බව තෙපලුවේ මහමායා දෙව් කරමින් පුදුම
සුදොවුන් පිය රජුගේ දෑතෙහි වැඩෙමින් ලබමින් රජ සැප මහමෙරක
සිදුහත් කුමරු දැඩි වුනා කය සූර ගැටවරයෙකු ලෙසට

දුටුවා හිඳින යාචකයෙක් මග කෙළවරක
කලකිරුණා සිත යන්තම් සසර ගැන
අසනීපෙන් ගෙන යන කඳ ඔසව ගෙන
දැකුමෙන් සිත එපා වුණේ මැරු කය

යන විට රජමාලිගයට සැදා කල
යශෝධරා තුරුලු කරන් පුත් කුමරා යහන මත
බලා දොරින් නික්මෙන විට සියලු සැප
තැබුවේ රාහුල යැයි පුත් කුමරු ගේ නමට

එතෙර වෙලා නෙරංජනා ගං ඉවුරෙන්
ගෞතම බුදු වන්නට කල සසර පිනෙන්
කන්ථක චන්නත් හැර දා තනිව ඉතින්
වන ළැහැබේ ඝන අඳුරේ කුමරුන් කුස ගින්නෙන්

දෙව් සුජාතාගේ කිරිපිඩු දානේ වැළඳු පාත්‍රේ උඩුගම් බලා ගියේ
වෙසක් පොහෝ දිනයේ බෝ ගහ සෙවණේ
ඒ මහා ගෞතම මුනිඳුන් බුදු වූයේ,

බොහෝ කලක් ධර්මය දෙසමින් ලොවට
ධමනය කරමින් නෙකවිද නරයින් එලෙස
ඒ මහා බෝසත් සමිඳුන් කියමින් - අනන්ද තෙරුන්. හට
යා යුතු යැයි දිවි ගමනේ - අවසන් කෙළවරට
කුසිනාරා සල් උයනේ මත සඳුන් දැව - ගෞතම බුදු හිමියන් පිරිවන් පෑවා සඳ

සුවිනි රත්නායක
ප්‍රථම වසර
මූල්‍ය අධ්‍යයනය අංශය

# සමිඳු සරණම පතා ........



ලතාවට රටාවට
ගලා බසින නුඹට
පුංචි ගල් පර වුවත්
හැකිය පසු කරන්නට
නිහඬ නිසසල මගක...../ /

තුඩින් තුඩ එකතු කර
මනස කැලඹුම් කරන
අතහරින්නට බැරිව
මහ දුකක් තුරුළු කර
සිත් විලම කළඹමින්
කඳුලු කැට වගුරමින්
සිතුවිල්ල ඇයි තවම
විඩා දෙන්නේ මෙලෙස...../ /

ගඟක් සේ ගලන්නට
අතැර සිතුවිලි බැම්ම
සමිඳු සරණම පතා
සසර තවමත් මෙමා...../ /


අවිශ්ක අබේරත්න
ප්‍රථම වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වය

"තුම්හේහි කිච්චං ආතප්පං"
"අක්ඛ තාරෝ තථාගතා"

"තථාගතවරයෝ වනාහි මාර්ගෝපදේශකයෝය. ඔබම කටයුතු කළ යුතුය"යයි බුදුරදුන් විසින්ම දේශනා කොට ඇත. මග්ගක්ඛද්ඤු,මග්ගවිදූ,මග්ග කොවිදෝ යන නම් වලින් ද බුදුවරු හදුන්වනු ලබයි.එහි අදහස වනුයේ නියම මාර්ගය දත් තැනැත්තා යනුය.ඒ නිසාම මාර්ගය නම් අංග අටකින් යුත් ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයයි.

"මග්ගානට්ඨාංගිකෝ සෙට්ඨො"ලොව ඇති ශ්‍රේෂ්ඨ මාර්ගයද ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.

බුදුන් වහන්සේ මෙම මාර්ගය සොයා ගනු ලැබුවේ මිනිසෙකුට නොඉසිලිය හැකි එමෙන්ම නොවිදිය හැකි අතිශය දුක්ගැහැටවලට මුහුණ දිමෙනි. සැපතක් ලගාකර ගත හැක්කේ මල් පියවිලි ඇතිරූ මාවතෙහි ගමන් කිරීමෙන් නොව බොහෝ දුෂ්කර මාර්ගයක පියමන් කිරීමෙන් බව උන්වහන්සේ අපට පසක් කරදුන්හ.උන්වහන්සේට අවශ්‍ය වුයේ අන් අයටද එම මාර්ගයෙහි ගමන් කිරීමට ඉඩ ලබා දීමටය.ඒ නිසා උන්වහන්සේ පරිසමාප්තියෙන්ම මාර්ගෝපදේශකයෙකි. ලොව පවත්නා විවිධ ආගම් හා ශාස්තෘවරුන් දෙස බලන විට මාර්ගෝපදේශකත්වය පිලිබඳ බුදුන් වහන්සේ අනුගමනය කලේ වෙනත් කිසිදු ශාස්තෘවරයෙක් අනුගමනය නොකල අති විශිෂ්ට පිලිවෙතකි.

"යථාවාදී තථාකාරී තථාවාදී යථාකාරී"යනුවෙන් බුදුන් වහන්සේ දේශනා කළේ අනුන්ට මග පෙන්වීමට පෙර තමන් ගුණ දහම් හි පිහිටිය යුතු බවයි. තමා ආදර්ශවත් වීම බුදු සිරිතේ දක්නට ලැබෙන ප්‍රකට ලක්ශණයකි.

අල්පේච්ඡතාවය පිලිබඳ ද බුදුන්වහන්සේ දේශනා කළේ තමා ද අල්පේච්ඡ දිවියක් ගත කරමිනි.රෝගින්ට උපස්ථාන කිරීමේ අගය වටහා දුන්නේ බුදුන් වහන්සේ රෝගින්ට උවැටැන් කිරීමෙනි."මහණෙනි,බොහෝ දෙවි මිනිසුන්ට හිත සුව පිණිස හැසිරෙන්න.දෙදෙනෙකු එක මගෙහි නොයන්න.මම ද මෙම මාර්ගයෙහි ඒකචාරිව යන්නෙමි"මෙය බුදුන් වහන්සේ ප්‍රතම ධර්ම දූත පිරිස අමතා දුන් ඔවදනයි. බුදු රදුන් අපට පෙන්වා දුන්නේ හොඳ මේවාය,නරක මේවාය,කුසල් හෝ අකුසල් මේවා නම් වේ,කල යුත්තේ හෝ නොකල යුත්තේ මේවාය,මේ දේවල් සිදු කලහොත් ලැබෙන ප්‍රතිඵල මේවාය යන්නයි. දයාබර මවක් පියෙක් තම දරුවන්ට අනුශාසනා ලබා දෙන්නේ යම් සේද,එලෙසින්ම බුදුන්වහන්සේ ද ලෝක සත්වයාට නිවැරදි මග පෙන්වා දුන්හ.ඒ නිසා උන් වහන්සේ කාරුණිකම මාර්ගෝපදේශකයාණෝ ය. සත්‍ය වශයෙන්ම බුදුන්වහන්සේට අවශ්‍ය වූයේ විශාල ශ්‍රාවක පිරිසක් ගොඩනගාගෙන විශාල බලයක් නිර්මාණය කර ගැනීමට නොවේ.අනේකවිධ වූ දුක් ගැහැට විදිමින් සසර ගමනෙහි සැරිසරන ලෝක සත්වයන් එම දුකින් මුදවා ලීමටයි.ඒ සඳහා තම ශ්‍රාවකයන් හික්මවා ගනු ලැබුවේද අනුපිළිවෙලිනි.එනම් සරල දහම් කොටස් පළමුවද,ගැඹුරු දහම් කොටස් දෙවනුවද විස්තර කර දීමයි."අනුපුබ්බ කථා"යනුවෙන් හඳුන්වන්නේ ද එයයි.මාසයක් ගත වන තුරුම එක් ගාථාවක් කට පාඩම් කර ගැනීමට නොහැකි වූ චුල්ලපන්ථක තෙරුන්ට මාර්ගඵලාවබෝධය ලබා හැකි වූයේ බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨ මාර්ග උපදේශකත්වය නිසාමය.

බුදුන්වහන්සේ ලෝක සත්වයාට  අවබෝධ කරන්නා වූ තවත් කරුනක් වේද එය කෘතගුණ දැක්වීමේ ගුණයයි.

"කතඤ්ඤු කතවේදී පුග්ගලෝ- දුල්ලභෝ ලෝකස්මිං"

කෘතවේදි මිනිසුන් ලොව දුර්ලභය,නුඹලාද කළගුණ සලකන්න යැයි අපට කීවේ එය ආදර්ශයෙන්ම පෙන්වා දීමෙනි.සත් සතියෙහි දෙවන දිනයෙහි අනිමිස ලෝචන පූජාව සිදු කරමින් ඒ බව ලෝක සත්වයාට පෙන්වා දුන්හ.එහිදී උන් වහන්සේ කෘතගුණ සැලකුවේ සිත් පිත් නැති අචේතනික වස්තුවක් වූ බෝ ගසටයි.

"පඤ්ඤා වනතස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස"

බුදුන් වහන්සේ මුල් තැන දුන්නේ ප්‍රඥාවටයි.ඒ ඒ පුද්ගලයාගේ බුද්දි මට්ටම සැලකිල්ලට ගෙන ඔහුට ගැළපෙන පරිදි ධර්මය දේශනා කළේය.කිසාගෝතමිය හට තම දරුවා සුව කර ගැනීමට කිසිවෙකු නොමළ ගෙයකින් අබ මිටක් ගෙන එන්න යැයි කිවේද ඇයට සත්‍ය වටහා දීමේ අදහසින්ය.යමෙකුට නිවැරදි සත්‍ය මාර්ගය වටහා දීමට අවශ්‍ය වූ විට බුදුන්වහන්සේ ඒවාට යොදා ගත්තේ උපමා,කතන්දර ආදියයි.ගොවියාට දහම් දෙසන විට කුඹුර,නියර,වී,හාල් නගුල ආදි යොදා ගත්හ.

"සද්ධා බීජං තපෝ වුට්ඨී
පඤ්ඤාවේ යුගනංගලං
හිරි ඊසා මනෝ යොත්තං
සකි මේ පලාපඑනං"

රජුන්ට දහම් දෙසන විට අධාර්මික පාලනයෙහි,යුද්ධයෙහි,වෛරයෙහි,පළිගැනිමෙහි ආදීනව දක්වමින් කතන්දර ගෙන හැර දැක්වූහ.භික්ෂූන් හට දහම් දෙසන විට පැවිදි බවේ සිල්වත්කමේ අනුසස්,දුසිල් බවේ ආදිනව ගෙන හැර දැක්වූහ.කුඩා රාහුල හාමුදුරුවන්ට ධර්මය දේශනා කළේ දිය බඳුන උපමාවට  ගෙනය. ඒ ඒ පුද්ගලයාට ගැළපෙන උපමා භාවිතා කරමින් ඔහුට තේරෙන භාශාවකින් යමක් වටහා දීම මාර්ගෝපදේශකයෙකු සතුව තිබිය යුතුම ගුණාංගයකි.
අනුන්ට අවැඩදායක,කිසිදු ප්‍රයෝජනයක් නොවන එකදු වචනයක්වත් බුදු මුවින් පිට කලේ නැත.ඇතැම් අය බුදුරදුන් හමුවට පැමිණ අනවශ්‍ය ලෙස ප්‍රශ්න ඇසුහ.බුදුරදුන් ඒවාට පිලිතුරු නොදීම නිහඬව සිටියහ.දිනක් වච්චගෝත්ත පැමිණ  බුදුරදුන්ගෙන් ප්‍රශ්නයක් ඇසුහ.බුදුහු නිහඬය.බුදුරදුන්ගේ මේ නිහඬතාවය වච්චගෝත්තට මහත් ගැටලුවක් විය.ඔහුට ඔහුගේ ස්භාවය වැටහිණි.එවිට බුදුහු දහම් දෙසා නිසි මග පෙන්වූහ.
ඒ අනුව බුදුන් වහන්සේගේ මෙම ගුණාංග තුලින් ප්‍රකට වන්නේ බුදුරදුන් තුල පැවැති ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වය යි.

පී.එල්.නිලූශා සෙව්වන්දි
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# වර්තමානයේ වෙසක්

ඇරඹුමට අනතුරුව
අවසානයක් නොහැගේ
නිර්වාණ පෙම් සුවඳ
සංසාර සිහින ඇහැරේ

දාගැබ් වෙහෙර බෝ රුක්
සියල්ලන් පහසේ
අහෝ, කිමද කිසිවෙක්
නිසි එලක් නොලදේ

අභිනිෂ්ක්‍රමණයෙන් ඈත
විකුණන සෙයින් දම් හා බුදුන්
සොයන සැප සඟරුවන
මවන පන්සල් මාළිගාවන්

වෙසග සිරි පැතුමන්
ආසිරිම පමණක් වෙවී
පූජා ආමිසම මිනිසුන්
ප්‍රතිපත්ති නොම කෙරී

අවබෝධයෙන් දිවි අනිත්‍යය
අතහැරීමෙන් යන නිවන්
කියාදුන්නත් වෙසක් වසන්තය
නිවාවිද කිසිවෙක් ගිමන්

ඇරඹුමට අනතුරුව
අවසානයක් නොහැගේ
නිර්වාණ පෙම් සුවඳ
සංසාර සිහින ඇහැරේ

චමෝද් ජයසූරිය
පලමු වසර
මූල්‍ය කළමනාකරණය අංශය

# නිවන හරි ඇතයි

ඔව් නිවන හරි ඇතයි
අස්ථිර බව දැන ගෙන හදන කූඩුව
රැක ගන්න හදද්දී ඉටි කවර දාලා ම
මගේ හිතට දැණුනෙම 'නිවන හරි ඇතයි'

මනුස්සයෙක් දුටුවා ම අසරණ
බඩට වෙලක් නො දීම එළවන මිනිස්සුත්
දන්සල් දෙයි සමරුවට ලොකු වට ම,
'අත් හැරීමේ පාඩමත්' අපිට හරි ඇතයි

දල්වපු ඉටි පන්දමෙන් ම
දැවිලා ගියාම ලස්සන පහන් කූඩු
"අයියෝ අපරාදෙ" කූඩුව කියන අපිට
අනිත්‍ය මෙනෙහි කිරීමත් හරි ඇතයි

මාපියන් මහලු මඩමේ තනි කර
වෙසක් අසිරිය යාන වාහන වලින් බලන්න යන
උස් මහත් උන සල්ලිකාර ළමයි දකිද්දි
ඉතින් කොහෙද බෝසත් බණ,
ඇතයි නිවන හරි ඇතයි

වත්තට ආවාම බල්ලෙක්
ලොකු ගල්ගෙඩි වලින් ගහලා එලවන මිනිස්සුත්
පෝයට දෙද්දී බලු කපුටු දානේ,
මුලා කරන්නේ කවුද, කාවද
ඉතින් නිවන අපට හරි ඇතයි

තව කෙනෙක් කරන නිසා කරන
අනුන්ට පෙන්න පින් කරනා
මේ ආටෝප අස්ථිර ජීවිතේ මොකටද
ඉතින් ඇත්තටම " නිවන "
හරි ඇතයි නෙමෙයිද අපිට

සඳදිනුදා ලියනආරච්චි
මූල්‍ය අධ්‍යන අංශය
පලමු වසර



# බුදු දහම සහ තරුණ පරපුර

බුදු දහම යනු ගෞතම බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද වසර (2500) කට වැඩි කාලයක් තිස්සේ පැවත එන දර්ශනයක් සහ ජීවන රටාවකි. එය ඉන්දියාවෙන් ආරම්භ වූ අතර එතැන් සිට අද දක්වා බටහිර රටවල් ඇතුළුව ලොව පුරා රටවල් ගණනාවක ව්‍යාප්තව ඇත. බුදු දහම මෑත කාලයේ තරුණ පරපුර අතර ජනප්‍රියත්වයට පත් වී ඇති අතර මෙම ලිපිය තුලින් තරුණ ප්‍රජාවට බුදු දහමේ ඇති වැදගත්කම පිළිබඳ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

තරුණ පරපුර සඳහා බුදු දහම වැදගත් විය හැකි ආකාර බොහොමයක් පවතී. බුදු දහම අපට යථාර්ථයේ ස්වභාවය සහ මනුෂ්‍ය ජීවිතය අවබෝධ කර ගැනීමට උපකාරී වෙයි. එමෙන්ම මෙලොව පවතින සෑම දෙයක් ම අස්ථිර බවත් සහ දුක් වේදනා මිනිස් ජීවිතයේ ආවේණික අංග වන බවත් පැහැදිලි කර දෙමින් දයානුකම්පාව සහ ප්‍රඥාව ප්‍රගුණ කිරීම තුලින් දුකෙන් නිදහස් වීමට මාර්ගයක් පෙන්වා දෙයි. එය කායික,මානසික පීඩනය සහ වෙනත් ආර්ථික හා සමාජීය ප්‍රශ්න සමග පොර බදිනා යෞවනයන්ට තමා පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීමට සහ ජීවිතයේ අර්ථය සහ අරමුණු සොයා ගැනීමට උපකාරී වේ.

බුදු දහමේ දක්නට ලැබෙන තවත් එක් වැදගත් කරුණක් වන්නේ එය පෞද්ගලික වගකීම සහ වගවීම අවධාරණය කිරීමයි. බුදු දහම තුළ අප කරනා වැරදි ක්‍රියාවන්ට දඬුවම් දෙන හෝ අප බේරා ගන්නා දෙවියෙකු පිළිබඳ සංකල්පයක් නොමැත. ඒ වෙනුවට අප විසින් සිදු කරන සෑම ක්‍රියාවකට ම ප්‍රතිවිපාකයක් ඇති අතර සතුටට සහ යහපැවැත්මට හේතු වන යහපත් දේවල් කිරීම අප සතුයි. මෙය සමාජ අපේක්ෂාවන් හෝ සම වයස් මිතුරන්ගේ පීඩනය වැනි බාහිර බලවේග වලට අනුව ක්‍රියා කරන යෞවනයන්ට එම බලවේග වලට හසු නොවී තම ජීවිතය සාර්ථක කර ගැනීමට උපකාරී වේ. බුදු දහම අපව දිරිමත් කරන්නේ අපගේ ම ජීවිත අප විසින් පාලනය කර ගැනීමට සහ අපගේ සාරධර්ම සහ අරමුණු වලට අනුව තේරීම් කිරීමටයි.

අද වන විට බොහෝ තරුණ පිරිස් සමාජයෙන් හුදෙකලාව ජීවත් වීමට කැමැත්තක් දක්වයි. එමෙන්ම අව්‍යාජ සබඳතා වෙනුවට සමාජ මාධ්‍ය හරහා මතුපිටින් පමණක් පෙනෙනා සබඳතා ඇති කර ගැනීමට යොමු වී ඇත. මෙවැනි සබඳතාව නිසා අද වන විට සමාජයේ විවිධ ගැටලු නිර්මාණය වී තිබේ. බුදු දහම අපට සමාජය සහ සමාජ සබඳතා ගොඩනගා ගැනීම පිලිබද මනා අවබෝධයක් ලබා දෙයි. බුදු දහම තුල ප්‍රජාව ගොඩනැගීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම පිලිබඳ පොහොසත් සම්ප්‍රදායක් ඇත. භාවනා වැඩසටහන් වලට සහභාගී වීම,බෞද්ධාගමික උත්සව වලට සහභාගී වීම සහ වෙනත් බෞද්ධයන් සමග එක්ව කටයුතු කිරීම තුලින් තරුණ ප්‍රජාවට සමාජ සබඳතා සහ සහයෝගිතාව වර්ධනය කර ගත හැකිය.

බුදු දහම සමාජ සාධාරණත්වය කෙරෙහි උනන්දුවක් දක්වන තරුණ තරුණියන්ට වැදගත් වන බුදු දහම උගන්වන්නේ සියලු ම ජීවීන් එකිනෙක සම්බන්ධ වන බවත් අපගේ ක්‍රියාවන් අන් අයට බලපාන බවත් ය. පරිසර ආරක්ෂණය,මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින හෝ වෙනත් ආකාරයේ සමාජ සාධාරණත්වයෙන් ක්‍රියාත්මක කිරීම තුලින් ලෝකය තුළ ධනාත්මක වෙනසක් සඳහා වැඩ කිරීමට මෙය තරුණයන්ට ඉවහල් වේ.

අවසාන වශයෙන් තරුණයාට බුදු දහම විවිධ ආකාර වලින් වැදගත් විය හැකිය. එය ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට,පුද්ගලික වගවීම සහ වගකීම දිරිමත් කිරීමට,සමාජය පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමට සහ සමාජ සාධාරණත්වය සඳහා ක්‍රියා කිරීමට ද තරුණ පරපුරට වැදගත් වේ. බුදු දහමේ එන මෙම වැදගත් සංකල්ප හොඳින් අවබෝධ කොට ගෙන ජීවිතය සාර්ථක කර ගැනීම තරුණ ඔබ සතු ය.

සතිර සංකල්ප
ප්‍රථම වසර
මූලය අධ්‍යන අංශය

# පින්බර රුවක්..

ගල් බොරළු පාරක
හුළං පොදක් නැති භවසක
සංසාර චාරිකාවේ
ඉසිඹුලන එක රුවක්

වසා සියොළඟ ම
පඬු පෙඟුණු රෙද්දෙන්,
යුද මර සෙන් පරදන්නට
පිය මනින්නෙක් තෙවෙනි ඇස සොයා


නොනිමි ආශාවන්
හඹා යන්නවුන් පසුකර
ඔවුනගේ වෙහෙස නිවන්නට
අමා පැන් පොදක් සොයා..

ලෝභයෙන් ද්වේශයෙන් මෝහයෙන්
පෙළෙන විට තුන් සිත ම
වඩයි බවුන්
සිත නිවා සනහාලන

නිමාවක් නැති සසර දනව්වේ
නිමාවක් සොයා පිය මනින
නොහික්මුණු හිත් පොඩ්ඩ
රිසි සේ සනසාලන්න

සංසාර චාරිකාවෙන්
ඉසිඹුලන්නට
සඳහට ම
වෙර දරන
පින්බර රුවක්..

ෂෙහාරා රණවීර
පළමු වසර
මූලය අධ්‍යයන අංශය



කේ.ඔ.එච්.කොඩිතුවක්කු
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# නිවෙනු අවැසි භව ගමන

එදා බුදු ගුණ අදත් ඒ ලෙස
අසන්නට පින ඇති නිසා
බුද්දෝත්පාද යුගයක මා
පින් කඳක් වී ඉපදුනා ........

කසාවතකට නිගරු වන මේ
සමාජය දෙස බල බලා
මම ගියේ බුදු රුව බලන්නට
ගමේ පන්සල වෙත එදා .......

වැලි පොළව නෑ එදා මෙන් අද
ටයිල් ඇතිරූ සිනිඳු පොළවක
බුදු පුතුන් වැජඹෙන අයුරු දැක
ඇති වුනේ මහ කනසුලකි මට ........

එදා බුදු හිමි දෙසු බණ පද
වියකිලා අද යයි මෙසේ
කසාවතකට සැගව ගත්
පර පුරුෂයන් වෙත් බෝ සේ .......

පිළිවෙතෙහි ඇති ආදීනව
නොදැන පුහු මිනිසුන් ලොවේ
සසර මඟ දිගු කරන්නට
මහා වෙහෙසක් ගතේ ........

ඉපිද මැරෙන සසර මඟේ
සමිඳු පමණි නෙතට සුවේ
දෙසූ බුදු බණ සිතට සුවේ
හිමිගෙ මඟයි භවේ සුවේ ........

කෙටිය දිවි මඟ දුකකි ඉපදුම
අනිසි බව දැක සියළු කම් සැප
අතැර බුදු මඟ නොයන් කිසි විට
බුදුන් පිළිවෙත රිසින් දැනගෙන
උතුම් හිමි ගිය මඟේ යනු මැන

නවෝදි උඩුවහවර
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# වෙසගේ සුවඳ.....

රන් පැහැ පුර හඳක් අද ඇත පායාලා
නිසසල ලෙසින් මඳ නල යයි ගත සිපලා
බෝ මළුවේ සිල් සුවඳින් සිත පිරිලා
වෙසගේ සිරිය දැක තුන් සිත සැනසීලා

දැල් වූ පහන් සිහිලෙන් බිය දුරු වේවා
මෝහය අන්ධකාරය සැම වැනසේවා
වඩනා මෙත් බලෙන් සැම සිත් සැනසේවා
අද එන මරුට එරෙහිව පින් රැස් වේවා

අනියත බවේ දහමින් අප සැනසේවා
අත් හැරීම යනු මෙයයැයි වැටහේවා
පරවන මලක් ලෙස කය ගැන සිත්වේවා
අවසන නිවන පමණක් උරුමය වේවා...

සඳදිනුදා ලියනආරච්චි
පලමු වසර
මූලය අධ්‍යන අංශය

# සාධුසම්මත ජීවිතයක්...........

*අත්තනාව කතං පාපං*
*අත්තනා සංකිලිස්සති*
*අත්තනා අකතං පාපං*
*අත්තනාව විසුජ්ඣති*
*සුද්ධි අසුද්ධි පච්චත්තං*
*නාඤ්ඤො අඤ්ඤං විසෝධයෝ*
*( ධම්ම පදය- අත්ත වග්ගය )*

තමා විසින් ම කරන ලද පාපය තමා කිලිටි කරන්නේ ය.තමා විසින් නො කරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව තම තමා අතම පවතින්නකි.කෙනෙක් තව කෙනෙකු පිරිසිදු නො කරයි.

අපි කිසියම් වරදක් කලේ නම් එයින් කිලිටි වුන අය වෙයි. යම්කිසි උපක්‍රමයකින්, හෝ නීතියෙන් සැඟවී සිටියත් තම හෘද සාක්ෂිය අනුව තමා වැරදිකාරයෙක්ම වන්නේය. කරන කලට පව් මිහිරිය මී සේ " යැයි වීදාගම මා හිමියන් ලෝවැඩ සඟරාවෙහි ප්‍රකාශ කර ඇති පරිදිම පව්කම් කිරිම මී පැණි මෙන් රසවත්, පහසු, සතුටුදායක වුවත් එය තාවකාලික වෙයි. ඊට උරුම වන ප්‍රතිඵල දුක් විපාකයන්ගෙන් අත්මිදීම පහසු නොවන සේම අපගේ මෙලොව යහපත වලකාලන අතර භවගාමී දිවි පැවැත්මට බාධා වනු ඇත.

පස් පවින් වැලකීම , දස අකුසලයෙන් වෙන්වීම, පරාභව කරුණු වලින් බැහැර වීම යනාදී බුදු දහම තුල පෞද්ගලික සුබ සිද්ධිය උදෙසා අදාල කර ගැනීමට හැකි ප්‍රායෝගික බෞද්ධ ඉගැන්වීම් අධයනය හා භාවිතයට පුරුදු පුහුණු වීම තුළින් ආධ්‍යාත්මික හා යහපත් චර්යාවන්ගෙන් හෙබි පිරිසිදු පුද්ගලයකු ලෙස ජීවත් විය හැක.

අප කෙතරම් නිවැරදි වුවත් සමාජයට නොකල වරදකට වැරදිකාරයෙකු වී ඇණුම් බැණුම් අපහාස විදීමට සිදුවන අවස්ථා ඇත. නිවැරදි අපට යමකු දඬුවම් කලත් අප වැරදිකාරයන් වන්නේ නැත. මක්නිසාද යත් අප වරදක් සිදු කොට නොමැති බැවිනි.තමා විසින් කරන ලද අයහපත් ක්‍රියා නිසා තමා අපිරිසිදු වෙනවා මෙන්ම තමා විසින් කරන ලද යහපත් ක්‍රියා නිසා තමා පිරිසිදු වීමද සිදු වේ. කෙනෙකු පිරිසිදු වන්නේ හෝ අපිරිසිදු වන්නේ ඔහුගේ ක්‍රියා කලාපය නිසාවෙනි.

අප විසින් පහසු වුවද සුන්දර වුවද අයහපත් දෑ සිදු කළහොත් අපගේ ජීවිතය දුෂ්කර, කටුක තත්ත්වයට පත්වීම නො අනුමානය. එම නිසාවෙන් ම ජීවිතයේ ගැටලු, දුක් විඳ දරා ගනිමින් යහපත් දේට සිත මෙහෙයවීම තුළින් උසස් දිවි පැවැත්මක් නිර්මාණය කර ගත හැකිය. කිරි කලයට ගොම බිංදුවක් වැටීමෙන් එය සම්පූර්ණයෙන් නිෂ්ප්‍රයෝජන වේ. ඒ නිසා අපගේ සාධුසම්මත ජීවිත නමැති කිරි කලයට අසාධු චර්යා නමැති ගොම බිංදුව එකතු වීමට ඉඩ නො තබා කටයුතු කරමු. එය එතරම් පහසු කාර්යයක් නොවුනද පියවරෙන් පියවර අප ඒ සඳහා පුහුණු වෙමු. යහපත් චර්‍යාවන්ට හුරු වෙමු. එයින් ජීවිතය ආලෝකමත් කර ගමු.

චන්දිමා චතුරංගනී
පලමු වසර
මූලය කළමනාකරණය අංශය

# සිහිකරමින් වෙසක් සඳ රැස් බොදු දන....

වෙසක් සඳයි නබෝගැබේ මෝදු වුණේ
මඳනල සමග තාලෙට බෝපත් සැලුණේ
ලෝසත අමා සදහම් සයුරේ ගිලුණේ
වෙසක් සිරිය මවමින් මැයි මල් පිපුණේ

ලුම්බිණි සල් උයනේ සිදුහත් ඉපදීම
ඇසතු සෙවනෙ බෝසත් රජ බුදුවීම
උපවත්තන උයනේ මුනි පිරිනිවනට පත්වීම
කරුණු තුනකි තෙමඟුල ලෙස සිදුවීම

සුමේධ ලෙසට එක් බවයක උපදින්නේ
පාරමිතාවයි වීර්යය පුරලන්නේ
බුදු බව පතා සිත යහපත් කරමින්නේ
දීපංකර බුදුහිමි විවරණ දෙන්නේ

බුදු බව ලබා අට වසරක් ගත වන්නේ
නා රජ කැළණි පුරටයි ඇරයුම දෙන්නේ
සමනල ගිරෙහි වම් සිරිපා තබමින්නේ
තෙවන ගමන මේ ලෙසටයි සිදුවන්නේ

අනුරපුරේ රන්වැලි සෑ රද දිලුණේ
ද්‍රෝණ ධාතු දාගැබ තුළ නිදන් වුණේ
ගැමුණු රජුයි එය කෙරුමට මුලපිරුණේ
වෙසක් දිනක ඒ හට මුල් ගල තැබුණේ

මිතුරු ඡන්න සමඟින් රථයට නැගුණේ
ව්‍යාධි රුවයි සිදුහත් හට නෙත ගැටුණේ
දිව්කතරේ අනියත බව වැටහෙන්නේ
වෙසක් පොහෝ දිනකයි මෙය සිදුවන්නේ

විජය කුමරු ලක් දෙරණට පැමිණීම
අනඳ තෙරුන් පිරිනිවනට පත්වීම
සිහල රජුන් රජ අභිසෙස් ගැන්වීම
වෙසක් පොහොය පාදක කර සිදුවීම

කිඹුල්වතෙහි යම මහ පෙළහර පෑම
පෑතිස් රජුන් රජ අභිසෙස් ගැන්වීම
කරුණු දහය වෙසක් දිනක සිදුවීම
බොදුදන සැම බොදු බැතියෙන් සැමරීම

ලෝ සිත් සතන් බොදු සිසිලෙන් නැහැ වේවා
රෝ බිය දුරුව ගත සිත සුවපත් වේවා
කෙලෙසුන් නැසී සිල් ගුණ දම් පැතිරේවා
පලසක් විලස නිවනට මල් ඇතිරේවා

කේ.පී.ජේ සිල්වා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# වෙසක් සඳ බැස ගියා

පන්සාලිස් වසක් දම් දෙසා
අපරිමිත කරුණා ගුණයෙන්
ලෝ සත්ත්වයෝ අඳුරින් මුදවා
සසර දුක නිම කරන්නට
මඟ කියා දුන් ආලෝකය
මනුදෙව් බඹු සෝ දුක් අතරේ
පරිනිර්වාණයට පියමැන්නේ
අනඳ තෙර සමගින්
අවසන් ගමන් වඩිමින්
උපවර්තන සල් උයනට පිවිසී වදාළේ
අකලට පිපි සල්මල්
දෙව් බඹු ඉසි පරසතු මදාරා මල්
වෙසක් සඳ සිසිල මැද
නාද වූ දිව්‍ය පංච තූර්යෙන්
තිලොවට තිලක වූ
ඒ උත්තම සම්දාණෝ
සකල ලෝ ධාතුවම කම්පා කරමින්
පිරිනිවනට පත් වී වදාළේ

අසීමිත කරුණා දයාවෙන්
ලෝ සත්වයන්ගේ දුක් නිවී
බියකරු සසර ගමනේ
අන්තය පහදා දුන්
ඝනඳුරට ආලෝකයක් වූ
වෙසක් සඳ බැස ගියා
අප කෙරෙහි ඒ කරුණාවෙන්
යලි වඩිනු මැන බුදු හිමියනේ

රුක්ෂිලා නානායක්කාර
මූල්‍ය අධ්‍යන අංශය
පළමු වසර

# සිත් නිවන වෙසක්

වෙසක් සිරි සුවඳ දසත විඳ පැතිරෙනා
දහම් සිත් මෙත් ස්නේහයෙන් පිබිදෙනා
අරුත්බර සිතුවිලිත් සිතපුරා දැල්වෙනා
රටපුරා පහන් සිත් කෙලෙස් දුරු කරවනා

පහන් සැරසිලි තැනින් තැන නෙක රටා මවමින්
සිත් සතන් භාවනාවන් ඉබේටම ඉටු කරමින්
තැවෙන්නට ඉඩ ඉතුරු නොකරන ජීවිතේ විඳිමින්
සංසාර බිය මෙනෙහි කරමින් වෙසක් සිරි බලමින්

පරාර්ථය පදනමින් එකිනෙකා ගැන සිතන
නැති නමුත් තමාහට අනුන් වෙනුවෙන් පුදන
වෙසගේ උත්සවාකාරය අරුත්බර ගන්වන
ඇත විවිධ දන්සැල්ද සිල් සුවඳ බෙදාදෙන

දැවී නොනිමෙන අහිංසක මිනිස් සිත් නිවන සේ
සැම දනන් සිත් පුරවනා දහම් සිතුවිලි මෙසේ
වෙසක් සිරි නාමයෙන් ලොව පුරා ගෙනයන ලෙසේ
මෙවන් සුව දෙන සිතුම් සෑමදා රැකගමු සිතේ

චමෝද් ජයසූරිය
ප්‍රථම වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සත්පියුමින් වැඩි කුමරුන්

පින්බර දිනක එදවස සිදු වූ    උපතේ
මහිමෙන් සත් පියුම් සැරසී ගත්    මිහියේ
තුන් ලෝ ගුරුගෙ පද රැව් දී ගත්    සරියේ
සහසැස් සුරන්ගේ සාදුව පැන    නැගුණේ

සත් පියුමතින් වැඩි ඒ කරුණා    ගුණයේ
බල දත් ඇත් රජුන්ගේ හිස විය    දෙරණේ
සල් මල් වලින් නැහැවුණු ඒ මිහි    තලයේ
දස අත පැතිරුණේ බෝසත් ගුණ    මහිමේ

සොලොස් වියේ දී බිම්බා    දේවියගේ
අත ගති නමුදු කළකිරුණේ ගිහි    දිවියේ
ලය පැලි නමුදු කන්ථක අසුගේ    විගසේ
කේශය කපා සැරසී ගැණි කහ    සළුවේ

චන්ද්‍රාලොකයෙන් නැහැවුණු ඒ    දවසේ
සත හට කුලුණු ගුණයෙන් ලැබ ගත්    නුවණේ
බලයෙන් එදා සතුගේ සිත විය    කමලේ
පින් ඇති දනන් හට නිවනට මග    පෙනුණේ

සිත ගත නිවෙන සුන්දර වූ ඒ    ගමනේ
මිනියට වුවද රිදුමක් නොම වී    තිබුණේ
සදවන් වත කමල නෙතගට වූ    විගසේ
දෙදණ පොළොවේ දෙඅත් විය ගිහියන්    හිසගේ

කෙටි කර දනගෙ දුක්ඛිත වූ ඒ    සසරේ
සත දන සුරන්ගේ වැද පිදුමන්    ලැබුවේ
කෝපය අගෙගරන හමුවේ    නොසැලියේ
ආලවක යකුද වචනින් දමනය    කෙරුවේ

කුල මල බේදයන් පා මුල විය    බුදුගේ
ශුද්‍ර බ්‍රහ්ම සැම හට ඉඩ දුන්    සසුනේ
ධර්මය කියා කහ වත් ගම් ගම්    සැරියේ
රෝ දුක් බියත් විසිවී ගියේ දුර    ජගතේ

බී.බී.ලිහින අමර ඩිල්ශික
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# පන්සිල් සුරැකුම හොඳම සමාජ සේවයයි.

කුඩා දරුවකු හැරෙන්නට, පන්සිල් පද ගැන නොදන්නා කෙනකු ඇතැයි සිතිය නො හැකිය. පස්පව් හි මොහොතක ආස්වාදයවිඳීමට සිදුවන ආදීනවය හා එයින් වැළැකීම පිළිබඳ ඇසෙන බණ දහම් ද බොහෝය. එහි ආදීනව පිළිබඳ දතයුතු සියල්ල සමාජයට කෙතෙක් විවෘත වුවත්, ඒ හා සම්බන්ධ සාපරාධී ක්‍රියාවල නම් අඩුවක් නැතැයි පොදු පිළිගැනීමක් ද ඇත.බොදු පසුබිම මත කෙරෙන
බොහෝ සාමූහික වැඩසටහන් ඇරැඹෙන්නේ පන්සිල් සමාදන් වීමෙනි. එය බොහෝවිට එම වැඩසටහන්වලම අංගයක් ලෙස මිස පන්සිල් රැකීමේ වුවමනාව මත නො කෙරේ. ඉකුත් දා ගුවන් විදුලියෙන් බන්ධනාගාර කොමසාරිස්වරයා ප්‍රකාශ කළේ බන්ධනාගාරවල තදබදය බලවත් ගැටලුවක්ව පවතින බවයි. මිනිසුන් විසින් කරනු ලබන සියලු වැරැදි පංච පාපකර්ම තුළට අන්තර්ග්‍රහණය කළ නොහැකිවුවද බහුතරයක් ඒ තුළට අයත් වෙයි.

පස්පව් හි ආදීනව ගැන විමසා බලනවිට ඒවායේ යෙදෙන්නන්ට පමණක් නොව සමාජයේ පරිබාහිර අයට ද එය බලවත්ව බලපාන බව පැහැදිලි වේ. පස්පව් හි යෙදෙන පුද්ගලයාට ලැබෙන ආදීනව කර්ම ඵල විපාක වශයෙන් මනා කොට බුදු දහම මගින් දේශිත බව අපි දනිමු. දහමට අනුව බොහෝ දෙනාගේ අවධානය යොමු වන්නේ ඒ පැත්තටය.

එහෙත් සමාජයට බලපාන ආකාරය විමසා බලන විට, පස් පව්හි යෙදීම නිසා අන් අයගේ සුරක්ෂිතභාව පුළුල් වශයෙන් බිඳ වැටෙන බව පෙනී යනු ඇත. රටක නීතිය හා සාමය උදෙසා වන රාජ්‍ය ආයතන වන පොලීසිය හා උසාවිය පවතින්නේ මෙම සුරක්ෂිතභාව තහවුරු කිරීමටය. එසේ නැතිව පව්කම්හි යෙදෙන්නාට ලැබෙන කර්ම විපාකවලින් ඔහු ආරක්ෂා කිරීමට නොවේ.

කුමන හේතුවක් නිසා හෝ ප්‍රාණඝාතයක යෙදෙන්නා කරන්නේ කුමක්ද තවත් මිනිසකුගේ හෝ වෙනත් සත්වයකුගේ හෝ ජීවත්වීමේ අයිතිය නැති කිරීමයි. පස්පව්හි මුලටම ප්‍රාණඝාතය යෙදි ඇත්තේ එයින් මනුෂ්‍යයාගේ පමණක් නොව සමස්ත සත්ව සංහතියේම මූලික අයිතිවාසිකම හා කැමැත්ත වන සිය ජීවිතය පවත්වාගෙන යෑමේ අයිතිය එමගින් අහෝසි කෙරෙන බැවිනි.ඒ අනුව ප්‍රාණ ඝාතයෙන් වැළකී සිටීම යනු ආදීනව වශයෙන් තමන්ට ලැබෙන කර්ම විපාකවලින් අත්මිදීම පමණක් නොව,
සියලු සත්වයන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමක් ද වෙයි. අංක එකේ සමාජ සේවය එය නොවේද ?

තමාගෙන් පරිබාහිර වූ කෙනෙකුගේ ප්‍රයෝජනය, යහපත හා සැපය පිණිස තිබූ දෙයක් සොර සිතින් ගෙන ඒ තැනැත්තාගේ සන්තකභාව අහෝසි කිරීම අදත්තාදානයයි. සොර සතුරු බිය නැති කෙනකු සමාජයේ නැති තරම් ය. සොරුන්ගෙන් ආරක්ෂාවීම සඳහා අපි බොහෝ වෙහෙසක් දරමු. පෞද්ගලික හා රාජ්‍ය ආයතන මේ සඳහා විශාල මුදලක් වැය කරයි.

සමාජ සදාචාර සම්මුති ඉක්මවා වැරැදි ලෙස කාම සේවනයෙහි යෙදීම කාම මිථ්‍යාචාරය යි. තෙවැනි සිල්පදය රැකීමට අසමත් බිරින්දෑවරුන් නිසා ඔවුන්ගේ ස්වාමිවරුන් ද, එසේම එබඳු ස්වාමිවරුන් නිසා ඔවුන්ගේ බිරින්දෑවරුන් ද කෙතරම් දුක් කරදර විඳී දයන්න අමුතුවෙන් විස්තර කළයුතු නැත. මහ මග ගියත් ගෙදර සිටියත් තෙවැනි සිල්පදය නොරැකෙන තැන කිසිවකුට හෝ සැනසීමක් නැත.

බොරුකීමෙන්, එනම් මුසාවාදයෙන් සෙස්සන් මුලා කිරීම බලවත් පාප කර්මයකි. එහෙත් බොහෝ අයට මේ පාප කර්මය පිළිකුලක්
නැතිව කළ හැකි විනෝදාංශයකි. සත්‍ය යටපත් කොට පුද්ගලයා නොමග යවන බැවින් බොරු කීම සමාජයට තදින් බලපාන අහිතකර ක්‍රියාවකි.
බොරු කියන්නාට නොකළ හැකි වරදක් නැත. කළ වරද, බොරුවෙන් වැසිය හැකියැයි ඔහු සිතන බැවිනි.

මිනිස් මනසෙහි ප්‍රකෘති ස්වභාව විකෘති වී මිනිසුන් නොමිනිසුන් බවට පත් කරවන සුරාපානය, මත් ද්‍රව්‍ය භාවිතය ආදිය නිසා පවුල තුළ,
සමාජය තුළ නොයෙකුත් ගැහැට ඇති කරයි. ඒ ගැන අමුතු විස්තර අවශ්‍ය නැත. බීමත්ව හැසිරෙන අය දකින අන් අය තුළ ඇතිවන්නේ කරුණාවක්,
මෛත්‍රියක් නොව පිළිකුලකි. පිළිකුල යනු ද්වේශ මූලිකය. ඒ අනුව සුරාපානය කරන්නන් විසින් අන් අය තුළ අකුසල සිත් ඇති කරවනු ලබයි.
මෙය අපට නො පෙනෙන පැතිකඩකි.

මේ අනුව පංච පාප කර්මයන්හි යෙදෙන්නන් විසින් බාහිර සමාජයට එල්ල කරනු ලබන තර්ජනය හා ඇති කරන ව්‍යසනය අතිවිශාල
පරාසයක විහිදී පවතින බව මනාව පෙනී යනු ඇත. පස් පවින් වැළැකී අන් අයගේ ස්වාධීනත්වයට, යහ පැවැත්මට උපකාර කිරීම විශාල සමාජ
සේවයකි. එක් අතකින් බලනවිට කෙනකුට කළ හැකි ලොකුම පරෝපකාරයක් ලෙසද එය හැඳින්විය හැකිය.

මීළඟට, කෙනෙක් පස් පවින් වැළැකී සිටීමට හේතු පාදකවන කාරණා කෙබඳු ද යන්න විමසා බලමු. ඒවා මෙසේ ගොනු කරගත හැකිය.

1. රාජ්‍ය නීතිය අනුව, වරදට ලැබෙන දඬුවමට බියෙන්

2. අන් අයගේ අපවාදයට, නින්දාවට ලක්වීමට නො එසේනම් තමාගේ තත්ත්වයට, ගරුත්වයට කැලලක් ඇති කර ගැනීමට බියෙන්.

3. තමාගේ අනාගත අභිවෘද්ධියට බාධාවක් වේය යන බියෙන්.

4. අන් අයට කරදරයක් පීඩාවක් වනු දැක්මට ඇති අකැමැත්ත නිසා (මෙය ආගමික පසුබිමක් මත මෙන් ම සමාජ සදාචාර ශික්ෂණයක් නිසාද විය හැකිය)

5. දිට්ඨධම්මවේදනීයව මේ භවයේම දුක් විපාක විඳින්නට සිදුවේය යන බියෙන්

6. මරණින් මතු දුගතිගාමී වී දුක් විඳින්නට වේය යන බියෙන්.

7. ඉන්ද්‍රිය සංවරයෙන් අවබෝධාත්මකව හික්මුණු හා දමනය වුණු (සුසිල්වත්) සතර බ්‍රහ්ම විහරණයෙන් ඔපවත් වූ අධ්‍යාත්මයක් තිබීම නිසා.

මේ අයුරින් දැක්විය හැකි තවත් කාරණා ඔබට ද යෝජනා කළ හැකි වනු ඇත. මේවායින් බොහොමයක් ම බිය සම්ප්‍රයුක්තය. තාවකාලිකය.
නිවැරැදි හික්මීම නොමැත්තන් අවස්ථාව එළැඹි කල්හි වරදෙහි යෙදීමට ඉඩ තිබේ. ඉහත අවසනට සඳහන් කළ, ඉන්ද්‍රිය සංවරයෙන්
මනාව ශික්ෂණය වූ තැනැත්තාට බියවීමට කරුණක් නැත.

බුදුරජාණන් වහන්සේ එවන් අයකු හඳුන්වා ඇත්තේ බ්‍රාහ්මණයකු ලෙසය. (ධම්ම පදය බ්‍රාහ්මණ වර්ගය, ((9) ගාථාව) සිල්වත්,
ගුණවත් තැනැත්තාට සක් දෙව්ඳු ද නමස්කාර කරන බව සක්ක නමස්සන සූත්‍රයේ දැක්වේ. එහෙත් පස්පව්හි නො යෙදෙන්නන්
සියල්ලන්ම මේ කාණ්ඩයට අයත් නො වන බව ඉහත කරුණු අනුව පෙනී යනු ඇත.

රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය පොලීසිය යි. මානව අයිතියට එරෙහිව ක්‍රියාකරන්නන්, සාධාරණ හා අපක්ෂපාතී යුක්ති සහගත විනිශ්චයකින් වැරැදි කරුවන් වූ විට ව්‍යවස්ථාපිත අධිකරණ නීතිය යටතේ දඬුවම් පැමිණවීම පිළිබඳ වගකීම පැවැරී ඇති තැන උසාවිය යි. පස්පව් හා සමාජය පිළිබඳ වූ මේ කතාවට මෙකී රාජ්‍ය ආයතන දෙක ඈඳා ගන්නේ කුමකටදැයි කෙනකුට සිතෙන්නට පුළුවන. මේ ආයතන දෙකේ  සියලුම රාජකාරී කටයුතු මාස කිහිපයකට අක්‍රිය කර තැබුවහොත් කුමක් සිදුවේද ?

මෙය හුදු මනඃකල්පිතයක් යැයි සිතෙන්නට ඉඩ තිබේ. නමුත් එවිට සිදුවිය හැකි දේවල් නම් කල්පිතයක් නොවේ.
රාජ්‍ය නීතිය අනුව, වරදට ලැබෙන දඬුවටම බියෙන් පස්පවිහි නො යෙදෙන්නන් එවිට වහා අවදිවනු ඇත. මනුෂ්‍ය ඝාතන, සොරකම්, මංකොල්ලකෑම්, කලකෝලාහල, කාම අපරාධ, මාර්ග අනතුරු, වංචා දූෂණ ආදී සිදුවීම් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යනු ඇත. අප රටේ වැඩියෙන් සිටින්නේ පන්සිල් පද කියවන්නන්ද , නැතහොත් පන්සිල් සමාදන්ව වාසය කරන්නන් ද යන ප්‍රශ්නවලට පිළිතුර එවිට ලබා ගත හැකිවනු ඇත.

පංච සීල ප්‍රතිපදාව යනු අධ්‍යාත්මික සංස්කරණයක ප්‍රතිඵලයක් මිස බාහිර සාධකයක් මත පාලනය වන්නක් නොවන බව බුදු දහම මගින් අවධාරණය කෙරේ. පරිබාහිර හේතුවක් මත වුවද පස් පවින් වැළැකී සිටීම නොවටිනා ක්‍රියාවක් ය යි මෙයින් අදහස් නො කෙරේ. එයිනුදු සමාජ සංරක්ෂණයක් සිදු වෙයි. එහෙත් බුදු දහමේ දැක්වෙන පිළිවෙත නම් හුදෙක් තමා විසින්ම තම කය, වචනය හා සිත දමනය කරගනු ලැබීමයි. එහි ආසන්නතම ප්‍රතිඵලය පන්සිල් සුරකින දැහැමි සමාජය යි.

ලෝකයේ මුලින් ම වරදට දඬුවම නියම කෙරුණු ආකාරය දක්නට ලැබෙන්නේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය. එම වරද සොරකම වූ අතර රජු විසින් දෙන ලද දඬුවම ලෙස සඳහන්ව ඇත්තේ දැඩි රැහැනෙන් පිටිතල හයා බැඳ, දැලි පිහියෙන් හිස මුඩු කොට වීදියෙන් වීදියට, මංසන්ධියෙන් මංසන්ධියට ගෙන යෑමෙන් අනතුරුව හිස ගසා දැමීමයි. නමුත් එමගින් සොරකම පාලනය වී නැති අතර, ඒ කරණකොටගෙන අනෙකුත් දස අකුසල ධර්මයන් ද පහළ වූයෙන් මිනිසා ආයුෂයෙන් පිරිහී ගිය බව සූත්‍රයේ දැක්වේ. ඒ අනුව රාජ්‍ය නීතිය අනුව සකස්වුණු දඬුවම සමාජ සංරක්ෂණයට සැබෑම විසැඳුම නොවන බව පැහැදිලි වෙයි.

එනිසා සමාජයේ යහ පැවැත්මට අවශ්‍ය වන්නේ නීතියට, විපාකයට බිය නිසා පවෙන් වැළැකෙන්නන්ට වඩා, මෙත්තා, කරුණා, මුදිතා ගුණ වැඩුණු, ඉන්ද්‍රිය සංවරයෙන් හික්මුණු, පාපය පිළිකුල් කරන, පිළිවෙතින් පෙළ ගැසුණු මිනිසුන් ය. ධන ලාභ සඳහා ඕනෑම පාප කර්මයක් කිරීමට මෙන්ම, ලාභ, කීර්ති, ප්‍රශංසා හා ප්‍රසිද්ධිය සඳහා ඕනෑම් මිථ්‍යාවක් සමාජගත කිරීමට ද මැලි නොවන අය මගින් සමාජ සංරක්ෂණයක් සිදු නොවේ. තමාට මෙන්ම අන් අය කෙරෙහි ද කරුණාවක් දයාවක් දැක්වීමට කැමැත්තේ නම්, කෙනකුට කළ හැකි විශිෂ්ටතම දෙයක් වන්නේ පංච පාප කර්මයන්ගෙන් වැළැකී සිටීමය. හොඳම සමාජ සේවය ද එයයි.

නෙතාරා සිල්වා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# තුරුණු වියේදීම දහමට යොමු වන්නේ .....

බාල, යොවුන්, තරුණ අවධි ගත වෙනවා
දහමට නැඹුරු වන්නට සිත මැලි වෙනවා
මහළු විය ලබන තුරු කල් ගත වෙනවා
පිංකම් නොවේ පව්කම් ටික මෝරනවා

ඩිජිටල් ලෝකයක් පසුපස දුව යනවා
රාග ද්වේශ මෝහය සිත දළු ලනවා
කෙළෙස් වඩවමින් අකුසල් උපදනවා
සසර කතර තුළ තවමත් වැළපෙනවා

බොරු ආටෝප කෙරෙහිම සිත ලොබ වෙනවා
තරුණ වයසනේ....ඇතැමෙක් පවසනවා
නමුදු, රුදු සසර තව තව දිගු වෙනවා
මැදහත් සිතින් කටයුතු කළ යුතු වෙනවා


සුපහන් තරුණ විය නොපහන් කරගන්නේ
කුමටද අකුසලය මත සිත බැඳගන්නේ
දහමට නැඹුරු වී සැනසුම සොයමින්නේ
ජීවිත ඇත්ත ඇති සැටියෙන් දැනගන්නේ

පින්බර වෙසඟෙදී අදිටන් කරගන්නේ
සිල් සුවඳින් ගුණදම් නිති රැකගන්නේ
තණ්හා මාන දුරලා සුවපත් වෙන්නේ
බුදුහිමි දෙසූ සදහම් මඟ අරගන්නේ

බෝහිමි පාමුලේ දුක් ගිනි දුරලන්නේ
මෙත් මුදිතා කරුණා ගුණ වඩමින්නේ
පැවිදි ඇසුර ලබමින් සිත් සනසන්නේ
තුරුණු වියේදීම දහමට යොමුවන්නේ

චතුරි සමරතුංග
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

නිශේනා විජේතුංග
මූල්‍ය අධ්‍යන අංශය
පළමු වසර



# බුදු හිමියනි...

ඔබ දෙසූ ඒ අමා මහ දහම් කඳ
පින් බලෙන් එක් ඇසුරු සැනදී
ඔබා දණ යුග - තබා සොඬ බිම
හික්මවූ සේ ඇත් රජුන්
ආලවක යකු - අඟුල්මල් තෙම
ඔබේ කරුණා ගුණ තලාවේ
ඇසූ මනරම් එක් වදනකින්
රහත් මාවත පිවිසියේ .............

හිමි එදා දුන් ඒ අමා පැන
එකදු අකුරක් නෑර පිලිගෙන
තවම රැව්දෙයි ගම් නියම්ගම්
සාධු මහතෙර ගුණ බලෙන් ...........

ඇසෙන ඒ බණ සවන වැකුණත්
රහත් මග ඵල කෙසේ වුවත්
සෝවාන් ඵල හෝ ලබන්නට
නොහැකි තරමට පිරිහී ගිය මේ
සමාජය බුදු ඇසින් දැකදෝ
පමා වන්නේ මෙතේ හිමියනි
වඩින්නට සිරිලක් තලාවට
මේ උතුම් වෙසගේ ............

පී.ජී.සී. අවිශ්ක අබේරත්න
ප්‍රථම වසර
මූල්‍ය අධ්‍යන අංශය

# ඉපැරණි සිරිලක වෙසක් අසිරිය

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ බෞද්ධ සංස්කෘතික හර පද්ධතීන් ප්‍රමාණවත් පසුබිමක් යටතේ ස්ථාපිත වූයේ ක්‍රි.පූ. තුන්වන සියවසේදී නොහොත් බුද්ධ වර්ෂ 236 දී සිදු වූ මහින්දාගමනයෙන් පසුවය..

ධාර්මික විනෝදයෙන් ප්‍රතිපදාවට

එබැවින් බුදු සමයේ ආභාසය මත එතෙක් මෙරට පැවති සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පරිවර්ථනය විය . තත්කාලීන සමාජගතව පැවති අභිචාර විධි සියල්ලක්මද අනුක්‍රමයෙන් වෙනස් මඟකට අවතීර්ණ විය.

බෞද්ධ ජීවන ප්‍රතිපදා මාර්ගයට අනුගත වූ ජනතාව ආගමික උත්සව පැවැත්වීම කෙරෙහිද වැඩි රුචිකත්වයක් දැක්වූහ. අවිහිංසාව , ශ්‍රද්ධාව භක්තිය හා බුද්ධිය පදනම් කරගත් ආගමික උත්සව රැසක්ද ඒ සමඟ ආරම්භ විය.

මෙම පූජෝත්සව පැවැත්වීම තුළින් අපේක්ෂිත අරමුණ වූයේ නුදෙක් ධාර්මික විනෝදය ලබා ගනිමින් කෙමෙන් කෙමෙන් බෞද්ධ ජීවන ප්‍රතිපදා මාර්ගයට ජනතාව අනුගත කරවීමයි.අනුක්‍රමයෙන් සංඛ්‍යාත්මකව වැඩි දියුණු වී ගිය මෙවැනි උත්සව වසර පුරාම මහත් හරසරින් පවත්වන තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. අනුරාධපුර යුගයේ පටන්ම ක්‍රමවත් පදනමක් යටතේ ඇරඹි මෙම උත්සව ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ තදින්ම මුල් බැස ගත්තෙ ඒවායෙහි පවත්නා උසස් ආගමික , දාර්ශනික හා සංස්කෘතික වටිනාකම් නිසාය..

මෙම උත්සව අතර පාරම්පරික රාජ්‍ය චාරිත්‍රයක් වන වෙසක් උත්සවය ශ්‍රී ලාංකීය බෞද්ධයන්ට අන් හැම උත්සවයකට වඩාම වැදගත් විය.

රාජ්‍ය හරසර

පුරාතන ශ්‍රී ලංකාවේ පැවති වෙසක් උත්සවයක් පිළිබඳ ප්‍රථම වාර්ථාව මහා වංශයෙහි හමු වන්නෙ දුටුගැමුණු (ක්‍රි.පු (101-77) ) රාජ්‍ය සමයේදීය. "මහා වේසාඛ පූජාව චතුවීසති කාරයිං" යනාදී වශයෙන් දුටුගැමුණු රජු වෙසක් උත්සව විසිහතරක් පැවැත්වූ බව එහි කියවෙයි.

ඓතිහාසික ලිඛිත වාර්ථා නොමැති වුවද වෙසක් උත්සව එයට පෙරද පැවති බව විශ්වාස කල හැකිය.

දුටුගැමුණු රජුගෙන් පසු තවත් බොහෝ රජවරු වෙසක් උත්සවය අඛණ්ඩව පැවැත්වූහ. භාතිය රජු (ක්‍රි.පු (38-67) වෙසක් උත්සව විසිඅටක් සිදු කළේය. බුද්ධ රූපය තනා රථයක තැන්පත් කර විදි සංචාරය කරමින් පැවැත්වූ මෙම උත්සවයේදී දුගී මගී යාචකාදීන්ට ආහාරපාන දීමේ සිරිතද පැවතිණි. වසභ රජුද ක්‍රි.ව (127-171) ) ඔටුනු පලන් වර්ෂයේ පටන්ම පිළිවළින් වෙසක් උත්සව විසි හතරක් සිදු කළේය. වෝහාරතිස්ස රජුද (ක්‍රි .ව (269-291) ) වෙසක් උත්සවය සිදු කොට ලක්දිව සියළු භික්ෂූන් වහන්සේලාට තුන්සිවුරු පිදීය. එපමණක් නොව ගෝඨාභය රජුද (ක්‍රි.ව (323-333) ජේට්ඨතිස්ස රජුද (ක්‍රි.ව (611-617) ) දළ්ල මොග්ගල්ලාන රජුද (ක්‍රි .ව (851-885) ද දෙවැනි සේන රජු ද රටවාසීන් හා එක්ව මහත් හරසරින් වෙසක් උත්සවය පැවැත්වූ බව සඳහන්ව තිබේ.

පූජාවලියේ වර්ණනා

මේ අනුව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් විශාල ප්‍රමාණයක්ද වෙසක් උත්සවය සඳහා වෙන් කෙරිණි . සෑම රජ කෙනෙකුගේම අනිවාර්ය රාජ්‍ය චාරිත්‍රයක් වූ මෙය පොලොන්නරු යුගය වන විට තවත් දියුණු විය.

දඹදෙනි යුගයේ පැවති ඉතා චමත්කාර වෙසක් උත්සවයක් පිලිබඳ පූජාවලියේ මෙවන් වාර්ථාවක් හමු වෙයි . ඒ දවස් මේඝ රාජයාණන් හස්තිරූප ව්‍යාජයෙන් බුදු මඟුලට බැස මිහිමඩලෙහි ඇවිදින්නා සේ ඒ ඒ දිග්හි යන්ත්‍ර බලයෙන් ඇවිදිනා හස්තිරූප පංතීන් හා පූජා ලෝලීන් දිවූ සමුද්‍ර රාජයාගේ මහ රළ පෙල සේ ඒ ඒ දිග්හි යන්ත්‍ර බලයෙන් දිවෙන අශ්ව රූප පංතීන් හා බුදුන්ගෙ මහා මංගල්‍යයෙහි අලංකෘත වූ පූජාවෙන් වෙහෙර සරසා සහස් සුවහස් ගණන් සංඝයා හා මුළු ලක්දිව සියළු මනුෂ්‍ය සේනා රැස්කොට වෙහෙර සිසාරා ගවු ගවු මානයෙහි පූජා පෙළහරින් සිටගත් සෑම මනුෂ්‍ය සේනාම අතුරු නොදී සිටින්නා සේ සිටින්නා සේ නියෝග කර.........

මෙම වෙසක් උත්සවය සිදු කරනුයේ දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ ( ක්‍රි.ව (1250- 1285) මූලිකත්වයෙනි. ඒ තුළින් වෙසක් උත්සවයක තිබිය යුතු සියළුම අංග ප්‍රකාශ වෙයි . එබැවින් මෙය පුරාථනයේ පැවති වෙසක් උත්සවයක නියම ස්වරූපය යයි නියත වශයෙන්ම පැවසිය හැකිය .

මෙහි " බුදු මඟුලට බැස "යනුවෙන් සඳහන්ව ඇති බැවින් වෙසක් උත්සවය සඳහා " බුදු මඟුල " යන්න යොදා ඇති බැව් පැහැදිලිය.

සම්මත නීතියක්ය

මහනුවර යුගයේ වෙසක් උත්සවය පැවැත්විය යුතු ආකාරය දක්වමින් සම්මත නීති මාලාවක්ද එකල පැවති බව මහා වංශයෙන් තහවුරු වේ .

ගෞරවය හා විචිත්‍රත්වය

කෝට්ටෙ යුගයෙහි කල වෙසක් උත්සව ගැන කරුණු විරලය. බුද්ධ පූජා පැවැත්වූ රජවරුන් රාශියක් ගැන සඳහන් වේ.

කොළඹ යුගයේදි ඉතා විචිත්‍ර අන්දමින් වෙසක් උත්සවය සිදු කෙරිණි. අද වන විට රාජ්‍ය වෙසක් උත්සවය ප්‍රමුඛව ලංකාවේ වෙසක් උත්සව ඉතා චිත්තාකර්ශනීය අන්දමින් සිදු කරයි.

සදුනි රශ්මිකා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# පුදුමයකි බුදු හිමියනි....

බුදු හිමියනි..
එදා හිමි ඔබ දෙසූ දහම් කඳු
අදටත් ජීවමාන ලෙස
පුදුමයකි හිමියනි
එදා ඒ දෙසූ දහම් කදින්
නිවි සැනසුන
ඒ මහා අසුර සෙන්
පුදුමයකි බුදු හිමියනි...
දණයුග බිම හොවා
තබා සොඬ බිම්
හික්ම වූ ඒ
මහා මද කිපි ඇත්රජුන්...
කඩුවක් අතින්ගෙන
ලේ පිපාසයෙන්
ඒ මේ අත ගිය අඟුල්මල්...
ඔබේ කරුණා ගුණ වීණාවේ
ඒ මනරම් වූ වීණා නදින්
රහත් මාවත කරා පිවිසියේ
හිමියනි ඔබ දෙසූ ඒ
දහම් කදේ මහිමය
පුදුමයක් බව අඟවමින්...
පුදුමයි හිමියනි
අදත් හිමි ජීවමාන ලෙසින්..
අසන ඒ බණ පද
සවන් වැකුනොත්
රහත් ඵල නැතිවුවද
සෝවාන් ඵල හො ලබන්නට පිනක් නැතිව
පිරිහී ගිය මිනිසුන් පිරි සමාජයක
බුදු හිමි දැක
නිවන් මගට පිවිසිමට පිහිට පතන
අපව සසරින් එතෙර කිරිමට
පමා වන්නෙ ඇයිද හිමියනි...
වඩින්න හිමියනි සිරිලකට මේ උතුම් වෙසගේ...

ආර්.එම්.එස්.ජීවංග
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# බුදුපියාණෙනි

තණ්හා ආශා අපමණ පොදි බැඳ
සසර ගමනට
පවම රැස් කරන
අඳුරු ලොවකට ආවඩන
අන්ධයන් අපමණය.....
විශ්ව තලයම එකම විපතක
ඇද වැටී ඇත හිමියනේ...
චක්‍රයක් මෙන් නිබඳ කතර සරන
මේ ගමනාන්තය
කෙසේ නිම වේද .....
ගිනි දැළු අතරින් පෙනෙන
මිරිඟුවක් පස හඹා යන
කාම සුඛල්ලිකානු වෙහෙසකර දිවියක..
පවිටු කෙලෙස් සිත් නසා
අවිද්‍යා මේඝයෝ මනු ලොව දුරු කර
මිනිස්කම රජ කරනට
ඔබ වහන්සේ අවැසිම මොහොතයි මේ
බුදුපියාණෙනි.....



ඩී. ඉමල්කා ලක්ශානි විජයරත්න
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



පී.ඩී.ඉරේෂා බර්නදෙත්
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සිරි කුටියේ කුදුළු සිත්තම්

කුරුටු ගෑ උස් බිත්ති අතරට
හිරු කිරණ ගලා ඒ හෙමිහිට
දනිමි මා උදා වී ඇති බව
නොදනිමි පසු වී කී හෝරාවද

ලෝභ කුරු දොර ඇරෙයි සීරුවට
කුසත් කෑගසා ඉල්ලයි ආහර
දෑතෙහි බත් පත කුස පුරවන්නට
දුටු විට කුස වර්ජනයක් කෙනෙහිම

එදා විඳි සැපය සතුටත්
මැවි මැවී වීලා සිහිනයක්
රස මසවුලු දිව පිනා ආවත්
කිම් නොදැනුනේ එය වේ විසක්

සම්බුදු සදහම් ගුණ නෑ දැනුනේ
අදමිටු පාපය සිත පිනවූයේ
පෝදා තෙමගුල් සිරි සිහිවූයේ
කමා කරම්පව්කලමේභවයේ

රවිඳු තිලක්ෂන
දෙවන වසර
මූලය අධ්‍යයන අංශය

# වෙසක් සඳවත

පිරුණු සඳවත
නුඹ ගැබේ හිඳ
ලස්සනයි නුඹ දිලෙන යුරු අද
වෙසක් සිසිලස ලොවට බෙදමින්
දෙව් ලොවක සිරි මවයි තුන් ලොව
සාධු නාදෙන් පහන් දැල්ලෙන්
සුවද දුම් හා සුදු මලින්
ලොව්තුරා සම්බුදු පදවි ලද
බුදුරදුන් පා නමදිමින්
කරපු අකුසල් කමා කරමින්
කුසල් සිත් සැම වඩයි සතොසින්
ඉතින් වෙසගේ සිරිය විදිමින්
දෙව් බඹුන් දෙති මල් වැහිත්
රාගයෙන් ද්වේශයෙන් මෝහයෙන්
මිරිකිලා ගිය සිත් සතන්
අමා දම් පදයකින් සැනසී
මෛත්‍රී සිත් පතුරමින්
ප්‍රතිපත්ති හා ආමිස පූජා
වඩයි වෙසගක සිරිය මවමින්
වෛවර්ණ වූ ඇඳුම් පසෙකලා
සුදු වතින් සංවර ගමනකින්
විඩාබර වූ සිත් ඇත්තෝ අද
කැලණි වෙහෙරේ බෝ මළුවෙ හිද
නිවී සැනසෙති නිවන් මග දැක............

ගිත්මි නවෝද
ප්‍රථම වසර
මූලය අධ්‍යයන අංශය



# බුදු පුරා වත්

ස්වප්නයෙන් නෙළුමක් සොඬින් ගෙන
ශ්වේත වර්ණිත මේඝයෙන් බැස
සත් වටක් පැදකුණින් අවසන
හස්තියෙක් කුස තුළට වැඩි සඳ

පුරක් පායා එන අහස යට
මලින් බර ලුම්බිණිය තුටු කොට
යහන් තනවා මවුන් මායට
පුතෙක් උපනා කෙලෙස් සසරට

සත් පියුම් සත් පියවරක් මැද
අග්‍රයන් අවසන් උපත ලද
අසමසම රන් වියන් මත හිඳ
කුමරු නම් වුණි සිදුහතුන් ලෙඳ

රම්‍ය සුරම්‍ය සුබ නමින් සැදි
මාලිගා මත මී රසින් බැඳි
සේද සළු ගත වටින් වැඩහිඳි
සොළොස් විය කුමරුවන් රසවිඳි

යශෝරාවක් පෙමින් වැලපිනි
සටන් මැද අතැගිලිත් යා වුණි
තෘෂ්ටියෙන් දින වසර ගත වුණි
රහල් පුත් රුවනකට පිය වුණි

සියල් සැප මත ගැටලු මතුවුණි
සතර පෙර පෙරනිමිතියට සිත්වුනි
අත්හැරීමක් සිතෙහි රජ වුණි
ගිහිගෙයින් කුමරුවෙක් නික්මිණි

ඇසතු බෝ රුක ආසනය විණි
මාර සේනා සොවින් නැහැවිණි
සඳකිරණ පින්වතින් ගිනැහුණි
බුදුන් ගෞතම ලොවට බිහිවුණි

දහම් රසයෙන් ලොවක් නැහැ විණි
කෙලෙස් සසරක කෙළවරක් පෙනි
සියල් සත බුදු ඇසින් සැනසුනි
නිවන් මග දැක සාදු සාදු කියවුණි

බුදු පුරා වත් කෙමෙන් වියැකුණි
අසූ වසරක් පිරී සපිරිණි
සකල සත බුදු සොවින් නැහැවිණි
බුදුරදුන් පිරිනිවන නික්මිණි...

තිසරි චමෝද්‍යා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



හසිදු ඩිල්ෂාන්
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# වෛශාඛ්‍යාර්ථ ප්‍රෙහේලිකා

උතුම් වූ සම්බුද්ධ ජයන්තිය සමරනු නිමිත්තෙන්, දහම් දැනුම වැඩි දියුණු කරනු වස්, කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධ්‍යයන අංශයේ ශිෂ්‍ය සංගමය විසින් සම්පාදිත වෛශාඛ්‍යය වර්ණනා සඟරාවට සමගාමීව සංවිධානය කරනු ලැබූ වෛශාඛ්‍යාර්ථ ප්‍රෙහේලිකා සඳහම් පැන විසඳුම් සමග එක්වීමට සියලු සැහැවත් බෞද්ධ ප්‍රජාවට කෙරෙන බැතිබර ආරාධනය යි.මේ සඳහා පහත සඳහන් ප්‍රහේලිකාව නැවත පිටපත් කර සම්පූර්ණ වශයෙන් ම පුරවා, (SCAN) හෝ (PDF) කරන ලද පැහැදිලි ඡායාරූපයක් පහත සඳහන් සබැඳිය ඔස්සේ අප වෙත යොමු කළ යුතුය. පහත ප්‍රොලිකාව පුරවා අප වෙත පිළිතුරු එවීමෙන් පසු එම පිළිතුරු අතරින් අහඹු ලෙස තෝරගන්නා ලද ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා ඔවුන්ගේ දහම් දැනුම ඇගයීමේ අරමුණින් වටිනා ත්‍යාගයන් පිරිගමනු ලැබේ. පහත සඳහන් කර ඇති සබැඳිය ඔස්සේ මැයි මස විසි එක්වන දිනට දිනට පෙර අප වෙත යොමු කල යුතුය.


හරහට

1. ධර්මිෂ්ඨ පාලකයන් විසින් අනුගමනය කළ යුතුය.
2. සිහිය යන්නට සමාන අරුත දෙන පදයකි.
3. බෝසතුන් පහළ වීමට ප්‍රථම සැලකිලිමත් වන කරුණකි.
6. තුන් සූත්‍රයට අයත් සූත්‍රයකි.
9. බුද්ධ චරිතයෙහි සරණක් අවැසි පුද්ගලයන්ට පිහිට වීමෙන් ප්‍රකට වන ගුණයකි.
13. ධ්‍යානලාභීන් අතර අග්‍ර වූ තෙරණිය වේ.
14. සොලොස්මස්තානයේ (16) වන නොහොත් අවසන් ස්ථානය හිමි කරගෙන ඇති වෙහෙර පිහිටා ඇත.

පහළට

1. බුද්ධත්වයෙන් පසුව පස්වග මහණුන්ට දේශනා කරන ලද ධර්ම දේශනාවයි.
4. අකුසල මූලයන්ගෙන් එකකි.
5. බුදුන් පිහිටක් අවැසි පුද්ගලයන් සොයා යන චාරිකාව මේ නමින් හඳුන්වයි .
7. ශ්‍රීලංකාවේ පැරණිම දාගැබ පිහිටා ඇති නගරය.
8. තිලෝගුරු ගුරු බුදුරජාණන් වහන්සේ පැවැතගෙන එන වංශය මේ නමින් හඳුන්වයි.
10. බුදුරජාණන් වහන්සේ ඝාතනයට රා කල හතක් පෙවූ හස්තියා.
11. බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපාසිකාව විය.
12. විනයධාරීන් අතර අග්‍ර වූ තෙරණිය.
15. සතර සංග්‍රහ වස්තූන් වලට ඇතුලත් ය.





https://forms.gle/ayNbQPLYej9dY8QB7

# සංස්කාරක මණ්ඩලය


උත්පල රත්නායක


යොහාන් අවිශ්ක


තුල්නෙත් ආරියතිලක


ඔෂිනි විහංගා


නවෝදී උඩුවහර


දේශාන් සාන්තන


අනුක උෂාර


සුලක්ෂනා සන්දීපනි

# සෝදුපත් කියවන්නන්


ධනුෂි ජයවීර


කාංචනා පිටවල


රාබිහා නවිෂාඩි


නිෆාල් මුන්හිම්


චතුරි සමරතුංග

# අනෙකුත් සහයක මණ්ඩලය


සචින්ත රාජපක්ෂ


රුකිත දම්සිත්


පිනාරා සමරජීව


නෙත්මි අතුකෝරල


අකිලා බුද්ධිනී


තෙනූෂා ගමගේ


භාග්‍යා රාජපක්ෂ


නෙතාරා සිල්වා


සතිර සංකල්ප


ෂෙහාරා රණවීර



https://www.facebook.com/FinanceStudentsAssociation

https://www.linkedin.com/company/finance-students-association-university-of-kelaniya/

https://www.youtube.com/c/DepartmentoffinanceUOK

කැලණිය විශ්වවිද්‍යාලයීය මූල්‍ය ශිෂ්‍ය සංගමයේ ප්‍රකාශනයකි.